සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2011, සයවැනි කලාපය, පිටු 151-174
ISSN 1800-1459

# අරාමගත නොවූ අනුරාධපුර පූජාභූමිය ආශ්‍රිත සිල්මෑණිවරුන්: මානවවංශ ලේඛන විමර්ශනයක්

**සමන් හඳරාගම[1], ගිහානි ද සිල්වා[2] සහ සුනේත්‍රා කුමාරවංශ[3]**

*[1,2]සමාජීය විද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය*
*[3]රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, රුවන්වැල්ල*

**සාරාංශය**

අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධිය ආශ්‍රිත සිල්මෑණිවරුන්ගේ ආයතනගත නොවීම හෙවත් ආරාමගත නොවීමට බලපාන ලද සාධක විමර්ශනය මෙම පර්යේෂණ පත්‍රිකාවේ මූලික පරමාර්ථය යි. ආරාමගත නොවී පූජා භූමිය තුළ සැරි සරන මෙකී චීවරධාරී ස්ත්‍රීන්ගේ ජීවිතවල සැඟවුණු යථාර්ථය හෙළිදරව් කිරීමේ තැතක් මෙමඟින් දරා ඇත. ගිහි ගෙය හැර පැවිදි ව සිටින්නේ වී නමුත් ඔවුන් ව සමාජය මගින් ද නැවත හැර දමා ආන්තික (Marginalized) සහ නොසලකාහැරීමට පාත්‍ර වූ සමාජ කොටසක් බවට පත් කොට ඇත. විවිධාකාර හේතු නිසා අසරණභාවයට පත් ලාංකේය ස්ත්‍රීන්ට සරණක් සපයන එක් මාධ්‍යයක් වන්නේ ඉහළ සමාජ අගයක් නො ලබන පැවිදිභාවය යි. එහිදී ද නැවත යමෙකු අසරණ වන්නේ නම් ඇයට හිමි වන්නේ මහ මඟයි. මෙය මෙම සිල්මෑණිවරුන් පිළිබඳ ව වන කටුක යථාර්ථය යි. අධ්‍යයනයෙන් පැහැදිලි වූ පරිදි මේ පිළිබඳ සමාජීය මෙන් ම ශාස්ත්‍රීය මැදිහත්වීම් අවම ය. එම රික්තය පුරවනු වස් ගිහි පැවිදි භූමිකා අතරමැදි තත්ත්වයක් නිරූපණය කරන සිල්මෑණිවරුන් පිළිබඳ ව මානවවංශ ලේඛන විමසුමක් (Ethnographic Analysis) මෙ මඟින් සිදු කෙරේ.

**කේන්ද්‍රීය වචනඃ** පැවිදිභාවය, සිල්මාතාව, ආරාමගත නොවූ, ආන්තීකරණය, නොසලකාහැරීම

## හැඳින්වීම

ස්ත්‍රිය විෂයෙහි පැවිදිභාවය යන්න වැදගත් වන්නේ, එමගින් ඇයට විවර වන නව සමාජ අවකාශය තුළ සාම්ප්‍රදායික ව ස්ත්‍රිය සමඟ බැඳෙන බන්ධනවලින් මිදී ආධ්‍යාත්මික විමුක්තියේ දොරටු විවෘත වන හෙයිනි. එය දුෂ්කර මාවතක් වන්නා සේ ම වර්තමානය වන විට ඊට හිමිවන සමාජ අගය ද පහළ බව ද මෙහිදී සිහිපත් කළ යුතු ව පවතී. එබඳු දුෂ්කරතා පවතින්නේ වූ නමුත් ඒ මාර්ගයේ ම ගමන් කිරීමට ඇතැම් ස්ත්‍රීහු පසුබට නො වෙති. මෙකී සියලු කරුණු අතරතුර පැවිදිභාවය නැතහොත් සිවුරු දැරීම ස්වකීය ආරක්ෂකයා මෙන් ම ජීවනෝපාය බවට පත් කරගෙන සිටින හෝ පත් කරගැනීමට සිදුව තිබෙන කාන්තාවන් පිරිසක් ලංකාව තුළ වෙසෙන බව ඇතැම් විට අවධානයට ලක් නොවූ කරුණක් විය හැකි ය. ඊට හේතු වන්නේ ඔවුහු බොහෝවිට බහු සංස්කෘතික ස්ථානයන්හී සෙසු ජනයා අතර සැරි සරමින් විසීම ය. මෙකී පැවිදි ස්ත්‍රීන් පිළිබඳ ව ගවේෂණාත්මක හෙළිදරව්වක් ලෙස මෙම අධ්‍යයනය දැක්විය හැකි අතර ඔවුන් සඳහා ආරූඪ නාමයන් භාවිත කර ඇත.

මෙකී පැවිදි ස්ත්‍රීන් 'සිල්මෑණිවරුන්' ලෙස හඳුනාගැනීමට බලපාන ලද හේතු කිහිපයක් වේ. දසසිල් මාතා යන යෙදුමෙන් ඔවුන් හැඳින්වීම දුෂ්කර වන්නේ

ඔවුන් සැබෑ ලෙස ම පැවිදි ව සිටිත් ද, දස ශීලය රකින්නේ ද යනාදී ගැටලු ශේෂ වන හෙයිනි. ඔවුන් අතුරින් ඇතමෙක් තමන් උපසම්පදාව ලත් භික්ෂුණීන් යැයි පවසන්නේ වූ නමුත් ඔවුන්ගේ චර්යාව ඊට සමපාත නොවේ. චර්යාව පිළිබඳ ව ගැටලු මතුවන්නේ බෞද්ධ විනය නීති ප්‍රකාර ව පැවිදි ස්ත්‍රියකට හුදකලාව හෝ ජනයා බහුල ව ගැවසෙන ස්ථානයන්හි වුවත් භික්ෂූන්ගෙන් දුරස්තර ව විසිය නොහැකි බවට දක්වා ඇති හෙයිනි. එසේ හෙයින් සමාජයේදී ද බහුල වශයෙන් භාවිත 'මාතාව', 'මෑණියෝ' යන්න සහ චීවරධාරීත්වය ද සැලකිල්ලට ගනිමින් සිල්මෑණියෝ යන යෙදුම ඔවුන් සඳහා භාවිත කරන ලදී.

## සාහිත්‍ය විමර්ශනය

මෙම කතිකාවේදී කාන්තා පැවිදිභාවය හා සම්බන්ධ ඉතිහාසය විමසීම අත්‍යවශ්‍ය ප්‍රවේශාත්මක එළඹුමකි. කාන්තා පැවිදිභාවය පිළිබඳ සංකල්පය භාරතීය සමාජය තුළ ස්ථාපිත වී ව්‍යාප්තියට පත් සංකල්පයකි. භාරතීය සමාජය තුළ විවිධ යුගයන්හිදී ස්ත්‍රිය පිළිබඳ ව පැවති දෘෂ්ටීන් වෙනසකට ලක් වී ඇති බව පෙනීයයි. වෛදික යුගය වන විට යම් ස්වාධීනත්වයක් හිමි සමාජීය ජීවිතයක් සහ විවිධ අයිතීන් හිමිකරගෙන සිටි භාරතීය කාන්තාව පශ්චාත් වෛදික යුගයේ බ්‍රාහ්මණ බලයේ නැගීමත් සමඟ දැඩි පීඩනයකට පත් වූ බව පෙනේ. පුරුෂාධිපත්‍ය පදනම් කොටගත් සමාජ ඇගයුම් මඟින් කාන්තාවන් පීඩනයට පත් විය. මෙසේ මොවුන්ට අහිමිවී ගිය අයිතීන් අතර ආගමික අයිතිය, අධ්‍යාපනික අයිතිය හා විවාහාතිරේක ස්වාධීනත්වය ආදිය වැදගත් වේ (පෙරේරා 2000: 4). 6 වන සියවස වන විට භාරතයේ පහළ වූ බුදුරජාණන් වහන්සේ වසර දහස් ගණනක් තිස්සේ පැවති මෙකී ගතානුගතික ආගමික හා සමාජ ක්‍රමයේ සාවද්‍යතාව පෙන්වා දී එය වෙනස් කිරීමට සාමකාමී විප්ලවයක් සිදුකරන ලදී (සුමනජෝති 2003: 19). සුමනජෝතිට අනුව(2003: 20-21) බ්‍රාහ්මණ සමාජය තුළ බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය සහ ක්‍ෂුද්‍ර වශයෙන් පැවති සමාජ බෙදීම් ඉවතලූ බුදුන් වහන්සේ ලිංග භේදය පදනම් කොට ගෙන භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා වශයෙන් සිව්වනක් පිරිසක් සමාජය තුළ ගොඩ නැගූ සේක (සුමනජෝති 2003: 20-21).

කොඩිකාර(2000: 83) දක්වන ආකාරයට තත්කාලීන සමාජයේ ශාසනික, සංස්කෘතික, ආගමික හා සමාජීය අංශයන්ගේ දියුණුව සඳහා කාන්තාවගෙන් ඉටු වූ සේවය ඉතා වැදගත් ය. බුදු දහමින් කාන්තාව හිමිකරගත් සමාජීය නිදහස කියාපාන ප්‍රබල සාධකයක් වශයෙන් භික්ෂුණී ශාසනය පෙන්වාදිය හැක. ප්‍රජාපතී ගෝතමියගේ ඉල්ලීම පරිදි ඇති කළා වූ භික්ෂුණී ශාසනය කාන්තා ජයග්‍රහණයක් ලෙස ද දැක්විය හැකි ය. ශුද්‍රයෙකුගේ තත්වයට පත්ව සිටි කාන්තාවට බුදු දහම හරහා මෙවැනි නිදහසක් ලැබුනේ, කාන්තාව විසින් සමාජය වෙනුවෙන් ඉටුකරන කාර්යභාරයේ වටිනාකම බුදුන්වහන්සේ විසින් හඳුනාගත් බැවිනි. පවුල් සංස්ථාව, විවාහ සංස්ථාව, ඥාතීත්වය, ලිංගික ජීවිතය ආදිය හරහා පීඩිතව සිටි කාන්තාව පැවිදිභාවය ලැබීම හරහා මහත් වූ අධ්‍යාත්මික විමුක්තියක් හා ස්වාධීනත්වයක් හිමිකර ගත් බව ථේරී ගාථා විමර්ශනය මගින් ද පැහැදිලි වේ.

මෙසේ ඇරඹි භික්ෂුණී ශාසනය ක්‍රමයෙන් භාරතය පුරා ව්‍යාප්තවීමත් සමඟ භික්ෂූන්ට හිමිව තිබූ ඇතැම් වරප්‍රසාද ලබා ගැනීමට භික්ෂුණීන්ට ද හැකියාව ලැබී ඇත. ඒ පිළිබඳ දීර්ඝ විස්තරයක් මෙහිදී ඇතුළත් නොවූ නමුත් ශාසන ඉතිහාසය ඊට සාක්ෂි දරයි. විජයසුන්දරට අනුව(1993: 163-164) මෙසේ ඇරඹි භික්ෂුණී ශාසනය අශෝක අධිරාජ්‍යයාගේ රාජ්‍ය සමයේ පැවති තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රදේශ නවයකට ව්‍යාප්ත කිරීමට කටයුතු සිදු කරන ලදී. ලක්දිව භික්ෂුණී ශාසනය ස්ථාපිත වූයේ ද මෙහි ප්‍රතිඵලයක් වශයෙනි. දේවානම් පියතිස්ස රජුගේ සොහොයුරෙකු වූ මහානාම යුව රජුගේ බිසව වූ අනුලා දේවිය ඇතුළු පන්සියයක් පිරිස මුල් වරට ලංකාවේ පැවිදි වූ භික්ෂුණීන් වූවාය. බුදු සමය පැතිරුණු මුල් සමයේදී ආගමික නිදහස ඉල්ලා සිටියේ එවක සමාජයේ සිටි ප්‍රභූ කාන්තාවන් බව පැහැදිලි වේ. නමුත් සෙසු රටවල කාන්තාවන්ට වඩා නිදහස් සමාජ පරිසරයක් තුළ කටයුතු කළ බැවින් භික්ෂු ශාසනය ඇති වී නොබෝ කලකින් භික්ෂුණී ශාසනය ද පිහිටුවා ගැනීමට ලාංකීය කාන්තාවන්ට හැකි විය.

එසේ ම බොහෝමයක් ප්‍රභූ පාන්තික කුල කාන්තාවන් භික්ෂුණී ශාසනයේ අනුගාමිගත්වය ලැබීම සහ ඒ නිසා සිදුවූ රාජ්‍ය අනුග්‍රහය භික්ෂුණී ශාසනයේ සීඝ්‍ර වර්ධනයට හේතු විය. බුදු දහම හරහා හිමි වූ නිදහසින් උපරිම ඵල නෙළාගත් ලාංකික කාන්තාවන් තරාතිරම් භේදයකින් තොර ව සසුන්ගත වීමේ ප්‍රවණතාවක් මෙකල දැකගත හැකිවිය. කෙසේ නමුදු, මිත්‍රාඥාණිස්සරීට අනවු(1993: 140) අනුරාධපුර යුගයේ දී ආරම්භ වී සීඝ්‍ර ව්‍යාප්තියකට පත් ලාංකීය භික්ෂුණී ශාසනය එම යුගයේ අවසානයත් සමඟ ම අවසන් විය. ඊට හේතු වූ ප්‍රධාන සාදක වූයේ විදේශ ආක්‍රමණ, බැමිණිතියා සාගතය, නිකාය භේදය සහ රාජ්‍ය අනුග්‍රහය නොලැබීයාම ආදියයි. මේ නිසා භික්ෂුණිය යන සංකල්පය සමාජය තුළින් බහිෂ්කරණයට ලක්වූ සංකල්පයක් වශයෙන් බොහෝ කලක් පැවති අතර, වර්තමානය වන විට ක්‍රියාත්මක දසසිල්මාතා සංකල්පය හරහා භික්ෂුණියගෙන් හිස් වූ රික්තය පිරවීමට යම් උත්භාසයක් ගෙන ඇති බව පෙනේ.

ද සිල්වාට අනුව(2009: 35-36) බ්‍රිතාන්‍යයේ යටත් විජිත සමයත් සමඟ පැමිණි ක්‍රිස්තියානි මිෂනාරි බලපෑම හේතුකොට ගෙන ලාංකේය සමාජය තුළ විශාල වශයෙන් වෙනස්කම් රැසක් සිදු විය. ප්‍රොතෙස්තන්ත්‍ර බුදු දහම (Protestant Buddhism) මෙහිදී සුවිශේෂී වන අතර ලාංකේය සාම්ප්‍රදායික බුදුදහම ප්‍රතිනිර්මාණය කිරීමට එමඟින් සමත් විය. "ප්‍රොතෙස්තන්ත්‍ර බුදු දහම තුළ ඇති ලක්ෂණ කිහිපයකි. එනම්, සාම්ප්‍රදායික බුදුදහම විසින් පවත්වාගෙන ආ අනෙකුත් ආගම් සමඟ පැවති සාමකාමී සහජීවනය ප්‍රොතෙස්තන්ත්‍ර බුදුදහම මඟින් අත්හරින ලදී, බුදු දහම ආගමක් ලෙස නොව දර්ශනයක් ලෙස පිළිගැනීමක් ද නිර්මාණය විය". මෙකී සංකල්පගත කිරීම් අනුව ප්‍රොතෙස්තන්ත්‍ර බුදු දහම ශ්‍රී ලාංකේය සමාජයේ කේන්ද්‍රීය පරිවර්තන රැසක් පිළිබඳ ඉඟි කරයි. භික්ෂුණීභාවයේ විකල්ප/ආදේශක ස්වරූපයක් වන දසසිල්මාතා ව්‍යාපාරය පවා මෙකී සමාජ පරිවර්තනයන් හි නිෂ්පත්තියකි.

කෙසේ නමුත්, මේ වන කාල වකවානුව වන විට භික්ෂුණී ශාසනය ලංකාව තුළ දැකගත නො හැකි විය. දිගු කලක් භික්ෂුණී ශාසනය රැකගත් ථෙරවාදී බෞද්ධ

රටක් වූ ශ්‍රී ලංකාවේ භික්ෂුණී ශාසනය පරිහානියට පත්ව සියවස් ගණනක් ගත වූ පසුව ද ආදේශක ශාසනයක් වශයෙන් සිල්මාතා සසුනක් ඇති කර ගැනීමට මෙරට වනිතාවන් සමත් වීම වනිතා විමුක්ති ව්‍යාපාරය හිමිකරගත් ජයග්‍රහණයකි. 1980 දශකය වන තුරුම දසසිල්මාතා සංකල්පය එතරම් සතුටුදායක මට්ටමක නොපැවතුනේ ඊට රාජ්‍ය අනුග්‍රහය ප්‍රමාණවත් පරිදි නොලැබීම, උගත් සිල්මාතාවන් හිඟවීම, ප්‍රත්‍ය පහසුව නොවීම සහ අයෝග්‍ය පුද්ගලයන් යාචක වෘත්තියට සමාන පැවතුම් සහිත ව එහි ගෞරවය කෙළෙසන පරිදි ජීවත්වීම වැනි හේතු නිසා ය. එසේම භික්ෂූන් වහන්සේ වෙතින් එතරම් සහයෝගයක් නොලැබීම ද අනන්‍යතාවක් ගොඩනගා ගැනීමෙහිලා බාධාවක් වී ඇති බව පෙනේ' (විජේබණ්ඩාර 1993: 121-122).

මෙවැනි වටපිටාවක් තුළ වර්ධනය වූ වත්මන් දසසිල්මාතා සංකල්පය තුළ දැකගත හැකි ගැටලුවක් වන්නේ ඔවුන් අයත් වන්නේ ගිහි ගණයට ද පැවිදි ගණයට ද යන්නයි. කසාවත් හැඳ දසසිල් සමාදන්වුව ද පැවිදි ව උපසම්පදා නො වූ හෙයින් ඔවුහු දසසිල් සමාදන් වූ උපාසිකාවන් වශයෙන් සැළකීමට සමාජය යොමු වී ඇත. එහිදී "දසසිල් අම්මා", "දසසිල් උපාසකම්මා" වැනි ඇමතුම් යොදා ගන්නා අතර ඔවුන් වාසය කරන ස්ථාන හැඳින්වීමට "උපාසිකාරාමය" වැනි ව්‍යවහාර භාවිත කෙරේ. එසේ ම මොවුන් පැවිදි අයගෙන් වෙන්කර දැක්වීම සඳහා දන් පිළිගැනීම, පිඬුසිඟා යාම, බණ පිරිත් කීම වැනි කෘත්‍යයන් කිසිවක් නො කළ යුතු බවට මතයක් නිර්මාණය කොට ඇත (විජේබණ්ඩාර 1993: 122). මෙවැනි හේතු පදනම් කොට ගෙන දසසිල්මාතාවන් සමාජයෙන් සහ ප්‍රධාන ධාරාවේ සංස්ථාගත බුදු සමයෙන් ආන්තීකරණයට නැතහොත් පරිහාරයට ලක් වූ පිරිසක් ලෙස සළකන ආකාරයක් දක්නට ඇත. ඔබේසේකර සහ ගොම්බ්‍රිච් විසින් සම්පාදිත Buddhism Transformed: Religious Change in Sri Lanka (1988) නැමැති කෘතිය දක්වන පරිදි දසසිල්මාතාවන් 'සමාජ සේවා' කටයුතුවල යෙදෙන හෙයින් ක්‍රිස්තියානි ආගමේ කන්‍යා සොයුරියන් හා ඇතැම් තත්ත්ව මත සමාන වන අතර විශාල සමාජ අවධානයක් ලබා නොමැති සමාජ කණ්ඩායමකි. කෙසේ නමුත් අනූව දශකයේ මුල් භාගයේදී ඇති වූ භික්ෂුණී ව්‍යාපාරය සමඟ ශ්‍රී ලාංකේය පැවිදි කාන්තාවන් කෙරෙහි යම්කිසි අවධානයක් යොමු ව ඇති බව සඳහන් කළ හැකි ය.

මෙම ආයතනගත දසසිල්මාතාවන් සමඟ සසඳා බලන විට ඉතා අඩු වරප්‍රසාද හා අයිතිවාසිකම් හිමි පිරිසක් වශයෙන් පූජාභූමි ආශ්‍රිත දසසිල්මාතාවන් පෙන්වා දිය හැක. මොවුන් පිළිබඳ ව විමසා බලන විට පැන නගින ගැටලුවක් වන්නේ මොවුන් සාධාර්මික පැවිදි පරමාදර්ශයන්ට අනුගත ජීවිතයක් ගතකරනවා ද යන්න යි. මේ නිසා පූජා භූමි ආශ්‍රිත දසසිල්මාතාවන් පිළිබඳ විමර්ශනය කාලීන අවශ්‍යතාවකි. බර්තෝලමියුස් Women Under the Bo Tree (1994) කෘතියෙන් පූජා භූමි ආශ්‍රිත සිල්මාතාවන් පිළිබඳ සුළු වශයෙන් අවධානය යොමු කර ඇත. මෙම අධ්‍යයනයට අනුව 1990 ගණන්වලදී මහමෙව්නා උයනේ දඟර ගැසුණු මුල් සහිත බෝ ගස් යට මෙම සිල්මාතාවන් (homeless nuns) දක්නට ලැබී ඇත. ඔවුන්ගේ වර්ධනයට බලපෑ ප්‍රධාන හේතුන් වූයේ දසසිල්මාතාවන්ට අනුග්‍රහය දැක් වූ හිටපු ජනාධිපති ප්‍රේමදාස මහතා ඝාතනය සහ ජනවාර්ගික ප්‍රචණ්ඩත්වය හේතු කොට ගෙන ආර්ථිකයේ ද සිදු වූ කඩා වැටීමයි (බර්තෝලමියුස් 1994: 193-194). මේ අනුව පූජා භූමි ආශ්‍රිත

සිල්මෑණිවරුන්ගේ වර්ධනය අහඹුවක් නොවන අතර වසර ගණනාවක් ඇවෑමෙන් තත්ත්වය තවදුරටත් සංකීර්ණ බවට පත්ව තිබිය හැක.

## පර්යේෂණ ගැටලුව

ඉහතින් හඳුනාගන්නා ලද තත්ත්ව පර්යේෂණයට බඳුන් කරනු වස් පහත දැක්වෙන පරිදි පර්යේෂණ ගැටලුවක් සකසා ගන්නා ලදී. එනම්, පූජා භූමි ආශ්‍රිත පැවිදි කාන්තාවන් ආයතනගත/ ආරාමගත නොවීමට බලපාන හේතු සාධක කවරේ ද? යන්න යි.

## පර්යේෂණ අරමුණු

මෙම පර්යේෂණ ලිපියෙහි ප්‍රධාන අරමුණ වන්නේ පූජාභූමි ආශ්‍රිත පැවිදි කාන්තාවන් පූජා භූමිය තුළ රැඳී සිටීමට බලපාන හේතු සහ ආයනතගත වීම කෙරෙහි පවතින බාධාවන් පිළිබඳව අධ්‍යයනය කිරීමයි. මෙකී ප්‍රධාන අරමුණ සාක්ෂාත් වන පරිදි අනු අරමුණු කිහිපයක් ද සකසා ගන්නා ලදී. ඒවා නම්, මෙම සිල්මෑණිවරු ගිහිගෙය හැරයාමට බලපෑ සමාජ ආර්ථික හේතු පිළිබඳව විමර්ශනය කිරීම, එම සිල්මෑණිවරුන් පූජා භූමියට පැමිණීමට බලපෑ හේතු පිළිබඳව අධ්‍යයනය කිරීම, පූජා භූමි ආශ්‍රිත සිල්මෑණිවරුන් නියුක්ත දෛනික කෘත්‍යයන් පිළිබඳ ව විමර්ශනය කිරීම, ඔවුන් පූජාභූමිය තුළ රැඳී සිටීමේදී මුහුණ දෙන ගැටලු හා අභියෝග පිළිබඳ ව අධ්‍යයනය කිරීම සහ එම සිල්මෑණිවරු පිළිබඳ සමාජය තුළ පවතින ආකල්ප විමසා බැලීම යන්න යි.

## පර්යේෂණයේ වැදගත්කම

බෞද්ධ කාන්තා පැවිදිභාවය ශ්‍රී ලාංකේය සමාජ හා ශාස්ත්‍රීය කතිකාවන්හි කේන්ද්‍රීය වස්තු විෂයයක් නො වේ. යම්කිසි සැලකිය යුතු අවධානයක් යොමු වී තිබේ නම් ඒ මෑතකාලීනව පිහිටුවා ගන්නට යෙදුන නව භික්ෂුණී ව්‍යාපාරය පිළිබඳ වාද විෂය කෙරෙහි ය. උක්ත පසුබිම තුළ සිට බලන විට ආරාමගත නොවූ පූජා භූමි ආශ්‍රිත සිල්මෑණිවරු ප්‍රධාන ධාරාවේ බෞද්ධ පැවිදි කාන්තා පැවිදිභාවය තුළ පවා ආන්තික කණ්ඩායමකි. මේ නිසාම ඔවුන් පිළිබඳ ප්‍රමාණවත් අධ්‍යයනයක් සිදු කෙරී නොමැත. මෙම පැවිදි ස්ත්‍රීහු ආන්තික කණ්ඩායමක් ලෙස හඳුනාගත හැක්කේ වූ නමුදු වඩා වැදගත් කරුණ වන්නේ ඔව්හු එම තත්ත්වයට පත්වීමට හේතු වූ කරුණු බොහෝ විට නොතකා හැර තිබීමයි. එලෙස අවධානයෙන් බැහැරව ඇති ඇතැම් තත්ත්ව පිළිබඳ විමසිලිමත් වෙමින් විවරණය කිරීම මෙහිදී සිදු කෙරෙයි. නිදසුන් ලෙස මෙම සිල්මෑණිවරුන් ගතකරන්නේ අනාරක්ෂිත බවින් පිරුණු අවධානම්සහගත ජීවිතයකි. මෙබදු ඛේදනීය ඉරණමකට ඔව්හු පාත්‍ර වන්නේ අහඹු ලෙස නිර්මිත හේතු නිසා නොවේ. ඒ සඳහා බලපාන ලද හේතු ඔවුන්ගේ ගිහි ජීවිතයේ තොරතුරු, පැවිදිවීම සහ ආරාමවලින් බැහැරවීම යනාදී කරුණු ඇසුරින් විමසීමකට ලක්කිරීම වැදගත් ය.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් යොදා ගන්නා ලද්දේ අනුරාධපුරයේ මහමෙවුනා උයනේ ශ්‍රී මහා බෝධි පරිශ්‍රය යි. ඓතිහාසික හා

පෞරාණික වටිනාකමකින් යුත් මෙම පූජනීය ස්ථානය සිංහල භික්ෂුණී ශාසනයේ මූලාරම්භය පිළිබඳ සාකච්ඡාවේ දී ද ඉතා වැදගත් වේ. එමෙන් ම, ගුණාත්මක දත්ත පදනම් කරගත් ගවේෂණාත්මක අධ්‍යයනයක් වන මේ සඳහා සසම්භාවී නොවන නියැදි ක්‍රමයට අයත් අවස්ථානුකූල නියැදීම (Purposive Sample) මගින් තෝරා ගන්නා ලද පූජා භූමියේ වෙසෙන සිල්මෑණිවරුන් දොළොස්දෙනෙකුගේ ප්‍රත්‍යයක අධ්‍යයන, අනුරාධපුර සංඝමිත්තා ආරාමයේ දසසිල්මාතාවන්, අටමස්ථානභාර විහාරස්ථාන භික්ෂූන් වහන්සේලා, පූජාභූමියේ ආරක්ෂක නිළධාරීන් සහ බැතිමතුන් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා භාවිත ය. මීට අමතර වශයෙන් සරල නිරීක්ෂණය දත්ත ඒකරාශී කිරීම උදෙසා භාවිත කරන ලදී.

## පැවිදි භාවය හා බැඳි හේතු විමර්ශනය කිරීම

සිල්මෑණිවරුන්ගේ ගිහි ජීවිතය හා පැවිදි භාවය පිළිබඳ ව කරුණු විමසා බැලීමේදී ඔවුන්ගේ ජීවිත තුළට එබී බැලිය යුතු ය. අනාවරණය කරගන්නා ලද එම බොහෝ තොරතුරු ප්‍රවර්ග ගතකිරීමේ දුෂ්කරතා මතු වුව ද එම හේතු සාධක අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකට සම්බන්ධ වී පවතින සමාජ, ආර්ථික සහ සංස්කෘතිකමය සාධක වශයෙන් හඳුනාගත හැකි විය. විමර්ශිත කරුණු ප්‍රකාරව පැවිදිවීම සඳහා බල්පා ඇති ප්‍රධානතම සාධකය වන්නේ 'ගිහි ජීවිතය තුළ පැවති ගැටලු' ය. මෙම සිල්මෑණිවරුන්ගේ පැවිදි ජීවිතයට යොමු වීමේ හේතු සාධක විමසීමේදී පැහැදිලි වන්නේ ආගමික පරමාදර්ශය ළඟා කර ගැනීමට වඩා ගිහි ජීවිතයේ පැවති වියවුල්කාරී තත්වයන්ගෙන් මිදීම අපේක්ෂා කරන ලද බවයි. වජිරා සිල්මාතාවගේ ප්‍රත්‍යයකය සලකා බැලීමේ දී ඇය සහෝදර සහෝදරියන් 12 දෙනෙකුගෙන් යුත් පවුලේ අටවැනියා ය. වයස අවුරුදු 20 දී යෝජිත විවාහයක් සිදු කර ගත් ඇය දරුවන් දෙදෙනෙකුද බිහි කළා ය. නමුත් කාලයත් සමඟ පවුලෙන් දුරස් වන ස්වාමියා පවුලට ඉටු කළ යුතුකම් පැහැර හරී. ඇය ප්‍රකාශ කළ පරිදි,

> "ස්වාමියා පවුලෙන් ඈත්වෙලා එයාගෙ නංගිගෙ ගෙදර තමයි හිටියෙ. හම්බකරන හැම සතේ ම එහෙට දුන්නා. ඒ නිසා මම දරුවෝ ලොකු මහත් කළේ කුලී වැඩ කරලා. නමුත් එයාල හිතුවක්කාරෙට විවාහ වුනා. එච්චර කාලයක් උන්නද මළාද බැලුවෙ නැති මනුස්සයා ඊට පස්සෙ දරුවො හරියට හැදුවෙ නෑ කියලා මට කරදර කළා. ඒවා ඉවසන්න බැරිව තමයි මම මහණවුනේ" (වජිරා සිල්මාතාවඃ 2010.06.18 දින සම්මුඛ සාකච්ඡාව සඳහා ගතකරන ලද කාලය පැය 02යි).

මෙයින් පැහැදිලි වන්නේ ස්වාමියාගේ මෙන් ම දරුවන්ගේ ක්‍රියා කලාපයක් හරහා කායික හා මානසික වශයෙන් පීඩාකාරී තත්වයන්ට මුහුණදීමට වජිරා සිල්මෑණියන්ට සිදු වී ඇති බවයි. යෝජිත විවාහයකින් විවාහ දිවියට එළඹුන ද නිසි ලෙස එකිනෙකා හඳුනානොගැනීම තුළ පවුල විසංවිධානයට හේතුව ඇති බව දක්නට ඇත.

වයස අවුරුදු 74 ක් වන සෝමා සිල්මාතාව සහෝදර සහෝදරියන් හය දෙනෙකුගෙන් යුත් පවුලේ තෙවැනි දරුවා ය. වයස අවුරුදු 24 දී ඇය

දෙමව්පිය කැමැත්තට විරුද්ධව විවාහ වී පවුලෙන් වෙන් වන අතර දරුවන් දෙදෙනෙකු ද ලබයි. නමුත් ඇගේ ස්වාමියා දැඩි මත් ලෝලියෙකු වීම නිසා ඇය නිතර ඔහුගේ කායික හා මානසික පීඩාවන්ට, හිංසනයට ගොදුරු විය. මෙය ඉවසා ගත නොහැකි වූ ඇය දරුවන් රැගෙන සිය දෙමව්පියන් වෙත පැමිණිය ද ස්වාමියා නැවත දරුවන් ඔහු භාරයට ගැනීම නිසා සහෝදර සහෝදරියන්ගේ මැදිහත් වීම මත පැවිදි දිවියකට යොමු වී ඇත. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය බොහොමයක් ලාංකේය පවුල් මුහුණ දෙන තත්ත්වයක් ලෙස හඳුනාගත හැකි ය.

48 හැවිරිදි විමලා සිල්මාතාවගේ ප්‍රත්‍යයකයට අනුව ඇය සහෝදර සහෝදරියන් තිදෙනෙකුගෙන් යුත් පවුලේ දෙවැනි දරුවා ය. වයස අවුරුදු 20 දී තම මස්සිනා සමඟ විවාහ වන ඇයට දරුවන් නොසිටි නිසා වඳ ස්ත්‍රියක් යැයි පවසමින් බීමත් ස්වාමියා විසින් නිතර තාඩන පීඩනයන්ට ලක් කොට ඇත. විවාහ ජීවිතය පිළිබඳ ව කලකිරුණු ඇය පැවිදි වී ඇත. විවාහ ජීවිතයක මූලික පරමාර්ථයක් වශයෙන් පවතින ප්‍රජනන කෘත්‍ය ඉටු නොවීම තුළ කාන්තාවක වශයෙන් සමාජයෙන් විඳීමට සිදු වන පීඩාකාරී මානසික තත්වය මෙයින් පැහැදිලි ය. නමුත් වඳභාවය වෛද්‍ය විද්‍යාත්මක සාධකයක් වශයෙන් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට ම පොදුවේ ඇති විය හැකි තත්ත්වයකි. එහෙත් බොහෝ විට ගතානුගතික ඇගයුම් කරපින්නාගත් සමාජයන්හි එබඳු ගැටලුවලදී දෝෂාරෝපණයට ලක් වන්නේ ස්ත්‍රී පාර්ශවය යි.

දෙවනුව ඉතා වැදගත් සාධකයක් ලෙස සලකා බැලෙන්නේ 'ආගමික නැඹුරුව' යන්නයි. පැවිදි ජීවිත කෙරෙහි බොහෝ පිරිසක් යොමු වීම සඳහා බලපාන්නා වූ ප්‍රබල සාධකයක් වශයෙන් ආගමික නැඹුරුව පෙන්වා දිය හැක. බොහෝ විට ආගමික නැඹුරුවක් ඇති පිරිස ගිහි ජීවිතය තුළ රැඳෙමින් අනගාරික ජීවිතය ළඟා කර ගැනීමට අපහසු වීම තුළ පැවිදිභාවය සඳහා යොමු වීම සිදුවේ. මෙහි මූලික පරමාර්ථය වන්නේ ආධ්‍යාත්මික විමුක්ති සාධනයයි. මෙහිදී මුලින් ම විමසා බැලෙන්නේ ධම්මා නන්දා සිල්මෑණියගේ ප්‍රත්‍යෙකයයි. වයස අවුරුදු 62 ක් වන ධම්මානන්දා සිල්මාතාව විවාහ දිවියට ඇතුල් වී දරුවන් දෙදෙනෙකු ද ලැබ සාමකාමී සහ සුන්දර විවාහ ජීවිතයක් ගත කළ බව ඇගේ අදහස යි. නමුත් කුඩා කළ සිට ආගම දහම කෙරෙහි දැඩි බැඳීමකින් කටයුතු කළ ඇය දරුවන් විවාහ වූ පසු ජීවිතයේ සැඳෑ සමය පැවිදිවීමේ අපේක්ෂාවෙන් ස්වාමියාගේ සහ දරුවන්ගේ අවසරය ලැබ පැවිදි දිවියට එළඹ ඇත.

68 වන වියෙහි පසුවන මෙත්තා සිල්මාතාව ද සහෝදර සහෝදරියන් පස් දෙනෙකුගෙන් යුතු පවුලක දෙවෙනියා ය. ඇයට වයස අවුරුදු 15 ක් පමණ වන විට හෘදයාබාධයකින් පියා මිය යන අතර පියා සතුව පැවති ඉඩකඩම්වලින් ලද ආදායමෙන් මව ඔවුන්ව පෝෂණය කොට ඇත. නමුත් ඇගේ බාප්පාවරු එක්වී ඉඩකඩම් පිළිබඳ තණ්හාවෙන් ඇගේ එක් සහෝදරයෙකුට වස දී මරා දමා ඇති අතර මව ඇගේ ගමට පලවා හැර ඉඩකඩම් අයිති කොට ගෙන ඇත. මෙයින් පසුව බාප්පාවරු එකතුවී ඇයව වයස අවුරුදු 16 දී ඇගේ මස්සිනාට බලෙන් විවාහකර දී ඇති අතර ඔහුට දාව දරුවන් දෙදෙනෙකු ද ලැබුවා ය. කුඩා කළ සිට ම තම මවගේ ඇසුර ලබමින් ආගම දහම කෙරෙහි

යොමු වූ ඇය ස්වාමියාගේ මරණයත් සමඟ නැවතත් ආගම කෙරෙහි යොමු වූ අතර දරුවන්ට හොර රහසේ පැවිදි විය. ආගමික නැඹුරුව මෙන් ම ස්වාමියාගේ වියෝවත් සමඟ ඇති වූ දුක, හුදකලාව ඇගේ පැවිදි භාවය කෙරෙහි සෘජු බලපෑමක් එල්ල කළ බව පැහැදිලි ය.

එසේ ම මෙම ප්‍රත්‍යෙක අධ්‍යයන හරහා විස්තර කළ සිල්මෑණිවරුන්ගේ වයස් මට්ටම ද මෙහිදී වැදගත් වේ. සසර පිළිබඳ අවබෝධයකින් යුතු ව නිර්වාණය හෝ යහපත් ආත්ම භාවයකට අවශ්‍ය කුසල් රැස් කරගැනීමට වැඩිහිටි විය තුළ දී බොහෝ පිරිසක් යොමු වීම සාමාන්‍යකරණයට ලක් වූ තත්වයකි. මෙම සිල්මෑණිවරුන් කුඩා කල සිට ආගමට ලැදි වුව ද ගිහි ජීවිත ගතකිරීමෙන් අනතුරුව පැවිදි වූවෝ වෙති. ජීවිතයේ සෑදෑ සමය ආගමික ශික්ෂණයකින් ගත කිරීමට බොහෝ පිරිසක් උත්සාහ දරන බවත්, ආධ්‍යාත්මික විමුක්ති සාධනය හරහා ලෝකෝත්තර නිදහස ළඟාකරගැනීමට උත්සාහ දරන බවත් පැහැදිලි වූ කරුණකි.

මින් අනතුරු ව විමසන්නේ 'හුදකලාව හා දරිද්‍රතාව' පැවිදිභාවයට බලපා ඇති ආකාරය යි. ධම්මදින්නා සිල්මාතාවගේ ප්‍රත්‍යෙක අධ්‍යයනය සලකා බැලීමේදී 66 වන වියෙහි පසුවන ඇය සහෝදර සහෝදරියන් දෙදෙනෙකුගෙන් යුත් පවුලේ බාලයා ය. 20 වන වියෙහි දී යෝජිත විවාහයක් සිදු කරගත් ඇය දරුවන් දෙදෙනෙකු ද ලැබුවා ය. කර්මාන්ත ශාලාවක කම්කරුවෙකු ලෙස කටයුතු කළ ඇගේ සැමියාට ලැබෙන වැටුපෙන් ජීවත් වූ ඔවුන් බොහෝ අගහිඟකම් මධ්‍යයේ වුව ද සතුටින් කල් ගත කොට ඇත. තිසි වයසට පැමිණි පසු දරුවන් ද තම හිතු මනාපයට විවාහ දිවියට යොමු වීම හා ස්වාමියා හදිසියේ අංශභාග රෝගියෙකු වීමත් සමඟ ධම්මදින්නා සිල්මෑණියන්ට ප්‍රශ්න රැසකට මුහුණ දීමට සිදු විය. දරුවන්ට ද ස්ථිර ආදායම් මාර්ග නොතිබීම නිසා ස්වාමියාගේ වියහියදම් දැරීමටත් ජීවත් වීමටත් කුලී රැකියාවල නිරත වීමට සිදුවන අතර වසර දෙකක කාලයක් රෝගී ව සිටි ස්වාමියා මියයාම නිසා ඇය හුදෙකලා වේ. දරුවන්ට ද බරක් විය නො හැකි වීම සහ ජීවත් වීමට මාර්ගයක් නොමැති වීම නිසා ඇය පැවිදි ජීවිතයට යොමුවී ඇත.

තව ද 74 වන වියේ පසුවන බේමා සිල්මතාව පිළිකා රෝගියෙකි. සහෝදරියන් දෙදෙනෙකුගෙන් යුත් පවුලේ දෙවැනි දරුවා වන ඇයගේ එක් සහෝදරියක් විවාහ වී සිටින අතර අනෙක් සහෝදරිය පැවිදි ජීවිතයකට යොමු වී ඇත. බොහෝ අගහිඟකම් මධ්‍යයේ පියාගේ ගොවිපළෙන් ලැබෙන ආදායමින් ඔවුන් ජීවත් වූයේ කුලී නිවසක ය. දෙමාපියන් සමඟ විවාහයක් සිදු කරගැනීමෙන් තොර ව ජීවත් වූ බේමා සිල්මෑණියන් දෙමාපියන්ගේ වියෝවත් සමඟ ඉතා අසරණ තත්වයට පත්වේ. මේ නිසා තම සහෝදරියගේ මාර්ගයෙන් පැවිදි දිවියකට ඇතුල් වන ඇයට ඒ වන විට වයස අවුරුදු 32 කි. මැයගේ ප්‍රත්‍යෙකයට අනුව දරිද්‍රතාව, හුදකලාව මෙන් ම සහෝදරිය ගත කරන නිදහස් ජීවිතය පිළිබඳ ඇති කර ගත් පැහැදීම ද මේ සඳහා හේතු වන්නට ඇතැයි සිතිය හැක.

අවසාන වශයෙන් දැක්විය හැක්කේ 'සසර කළකිරීම' සහ 'අනිත්‍ය පිළිබඳ අවබෝධය' ද පැවිදිභාවයට බලපා ඇති බවයි. මෙහිදී මූලික වශයෙන් සලකා බැලෙන්නේ ධම්මිකා සිල්මෑණියන්ගේ ප්‍රත්‍යෙකය යි. දැනට වයස අවුරුදු 63 ක් වන ඇය වයස අවුරුදු 25 දී යෝජිත විවාහයක් සිදු කරගන්නා අතර

දරුවන් නොවී ය. වෘත්තියෙන් රියදුරෙක් වූ ඇගේ සැමියා මුලදී ඉතා ආදරයෙන් කටයුතු කළ බවත් ක්‍රමයෙන් වෙනස්කම් කිරීමට පටන් ගත් බවත් ඇය ප්‍රකාශ කළා ය. මේ පිළබඳ ව සොයා බැලීමේ දී ඇයට දැන ගන්නට ලැබී ඇත්තේ ඔහු වෙනත් කාන්තාවක සමඟ අනියම් සම්බන්ධතාවක් ඇති කර ගෙන සිටින බවයි. මේ නිසා ජීවිතය පිළිබඳ කලකිරෙන ඇය පැවිදි වීමට යොමු වේ. මේ පිළබඳව අදහස් දැක්වූ ඇය ප්‍රකාශ කළේ,

> "හැමදේ ම එක වගේ සංසාරේ පුරාවට ම පවතින්නේ නෑනේ. මිනිස්සු කොහොමත් ඉක්මනින් වෙනස් වෙනවා. ලස්සනට ඇදිලා යනවා වැඩියි. ඒ නිසා ලෝක ස්වභාවය අවබෝධ කර ගන්න මට පුළුවන් වුනා. මම රණ්ඩු වෙන්න ගියේ නෑ. සැමියට කියලා තමයි මහණ වෙන්න ආවේ" වශයෙනි (ධම්මිකා සිල්මාතාවः 2010.06.06 දින සම්මුඛ සාකච්ඡාව සඳහා ගතකරන ලද කාලය පැය 01 වි. 45යි ).

මේ අනුව අනිත්‍ය වටහා ගැනීමට තරම් යම් තාර්කික හැකියාවක් ඇ සතු වූ බව පැහැදිලි ය. හිංසාකාරී පරිසරයක් තුළ තව දුරටත් ලෞකික බැඳීම් වැඩිකර ගන්නවාට වඩා සසර කෙළවර කිරීම උදෙසා කටයුතු කිරීම හරහා මතු අත්මයේදී හෝ මෙවන් විපත්වලින් බේරීම ඇයගේ අපේක්ෂාව යි. එමෙන් ම 45 වන වියෙහි පසුවන සුමනා සිල්මෑණියන් 27 වන වියෙහි දී විවාහ දිවියට ඇතුල් වන අතර එක් දියණියක් ද වූවා ය. දියණියගේ විවාහ කටයුතු අවසන් වීමට පෙර පිළිකා රෝගයකින් ඇගේ ස්වාමියා මිය ගිය අතර ඒ වන විට ඇයට වයස අවුරුදු 43 කි. දියණියට වයස අවුරුදු 15 කි. ස්වාමියාගේ වියෝවත් සමඟ ඇතැම් පුරුෂයන්ගේ බලපෑම්වලට ලක් වන ඇය ඒ පිළිබඳ අදහස් දැක්වූයේ මෙසේ ය.

> "ස්වාමියා මිය යද්දී මට වයස 43 ක් වුනාට තරුණ පෙනුමක් තමයි තිබුණේ. අවුරුදු 15 ක දුවෙක් ඉන්නවා කියලා බැලු බැල්මට පේන්නේ නෑ. ඒ නිසා අහල පහල පිරිමින්ගෙන් නිතර මට කරදර ආවා. පස්සෙ ඒවාගෙන් බේරෙන්න බැරිම තැන දුවට අවුරුදු 17 වුනාට පස්සේ එයාව විවාහ කරලා දිලා දේපළත් එයාගේ නමටම ලියලා මම පැවිදි වෙන්න තීරණය කළා. මගේ ස්වාමියා තරම් හොඳ සැමියෙක් මම කවදාවත් දැකලා නෑ. එයාට ද්‍රෝහි වෙන්න මට පුළුවන්කමක් තිබුණෙ නෑ. දරුවෙකුත් එක්ක තනි වුනහම ගෑණියෙකුට ජීවත් වෙන්න මේ සමාජයේදි හරි අමාරුයි. ඒ නිසා මම ගොඩක් ජීවිතේ ගැන කළකිරුණා" (සුමනා සිල්මාතාවः 2010.06.20 දින සම්මුඛ සාකච්ඡාව සඳහා ගත කරන ලද කාලය පැය 01 වි. 30යි).

වැන්දඹුභාවය සමඟ ඇතිවන හුදකලාභාවය කාන්තාවකට එල්ල කරන බලපෑම මෙයින් පැහැදිලිය. මේ හරහා ස්ත්‍රියගේ ස්වාධීන පැවැත්මට බාධා එල්ල වේ. මේ නිසා සැම විටම ඇය ලිංගික භාණ්ඩයක් වශයෙන් සූරා කෑමට ලක් කළ හැකි ඒ සඳහා පහසුවෙන් අවනතවන තැනැත්තියක වශයෙන් හඳුනා ගෙන පීඩනයට පත්කිරීමට සමාජය උත්සාහ දරයි.

48 වන වියෙහි පසුවන සුභා සිල්මෑණියන් උසස් පෙළ දක්වා අධ්‍යාපනය හැදෑරූ අයෙකි. තිසි වයසට පැමිණීමත් සමඟ විවාහ දිවියට පත් වන ඇය

දරුවන් දෙදෙනෙකු ද ලැබුවා ය. රජයේ ආයතනයක ලිපිකරුවෙකු වූ ඇගේ ස්වාමියා ලබන වැටුපෙන් දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීමට කටයතු කර ඇති අතර වැඩිමහල් පුතා ඉංජිනේරුවරයෙකු බවට ද දෙවැනි දරුවා සමුපකාර නිලධාරියෙකු බවට ද පත් වේ. නමුත්, ඔවුන් විවාහ වී පවුලෙන් වෙන්වී යාමත් සමඟ දෙමාපියන් පිළිබඳ සොයා බැලීමක් සිදු කර නැත. මීට හේතුව වන්නේ ඔවුන් වෘත්තීය ජීවිතය පදනම් කොට ගෙන සමාජය තුළ ඉහළ ගෞරව සම්මානයට පාත්‍රවෙමින් ඔවුන්ගේ තත්වයට ගැළපෙන පරිදි විවාහවීමයි. කල් ඇවෑමෙන් අංශභාග රෝගියෙකු බවට පත්වන ඇගේ සැමියා අවුරුද්දක පමණ කාලයක් එක් තැන් වී දුක් විඳ මිය යාමත් සමඟ ජීවිතය පිළිබඳ කළකිරීමට පත් වන ඇය සසර පිළිබඳ අවබෝධයකින් අනිත්‍ය වටහා ගෙන පැවිදි ජීවිතයට යොමු වේ. මෙම සියලු ම හේතු සමාජ සාධක ඇසුරින් විවරණය වන බව දක්නට ඇති තත්ත්වයකි.

## පැවිදිභාවය ලැබීම සහ ආරාමික ජීවිතය

මෙම සිල්මැණිවරුන් සියලු දෙනාගේ ම අදහස් දැක්වීම් අනුව ඔවුන් ගුරු මාතාවක යටතේ පැවිදි ජීවිතයකට අවතීර්ණව ඇත. විවිධ ප්‍රදේශ නියෝජනය කරමින් පූජාභූමියට පැමිණි මොවුන්ගේ මුල් ගම් ආශ්‍රිත ආරාමවලදී පැවිදිභාවය ලබා තිබීම ද වැදගත් ය. උදාහරණයක් වශයෙන් වජිරා සිල්මැණිය ඇඹිලිපිටිය ප්‍රදේශයේ අයෙක් වූ අතර කතරගම ආරාමයක ගුරු මෑණියෙකු යටතේ පැවිදිභාවය ලැබූ බවත්, පැවිදි වී ගුරු මෑණිය යටතේ ඇගේ ආරාමයේ සිටියදී ගෝල දසසිල්මාතාවන් සමඟ ඇති කර ගත් ආරවුලක් නිසා ගුරු මෑණියන් සිරිපාදේ ආරාමයකට වැඩිය බවත් ප්‍රකාශ කරන ලදී. මේ අනුව පැවිදි ජීවිතයකට යොමු වුව ද ස්ත්‍රීත්වයට අනන්‍ය වූ චින්තන රටාවන්, චර්යා රටාවන් මඟින් ව්‍යුක්ත වීමට මෙම සිල් මාතාවන්ට නො හැකි ව ඇත. ග්‍රාමීය කාන්තාව පිළිබඳ ගොඩනැඟී පවත්නා දෘෂ්ටිය වන්නේ නිතර ප්‍රචණ්ඩකාරීව හැසිරෙන, ඕපාදූප සොයන, අනෙකෙකුගේ සැපතකදී ඊර්ෂ්‍යා සහගත, එකට එක් වූ විට ආරවුලක් ඇති කර ගැනීමට වැඩි නැඹුරුවක් දක්වන තැනැත්තියක් යන්නයි. ගිහි ජීවිතයේදී ලේබල් කිරීම්වලට ලක් වන ඔවුහු පැවිදි ජීවිතය තුළ දී ද පරණ පුරුදු අත් නො හරිති.

උත්තරා සිල්මෑණිය දැක් වූ පරිදි ඇය පදවිය ප්‍රදේශයේ පදිංචිකාරියක් වූ අතර මැදවච්චියේ ගුරු මෑණියෙකු යටතේ පැවිදි දිවියට ඇතුල් වී ඇත. පැවිදි වී ආරාමික ජීවිතයක් ගත කොට ඇති ඇයට ගුරුමෑණියන් විසින් ආරාමය විකුණා දැමීම හේතු කොට ගෙන වෙනත් ආරාමයකට සංක්‍රමණය වීමට සිදු වී ඇත. එසේ ම ධම්මිකා සිල්මෑණියන් කෑගල්ල ප්‍රදේශයේ පදිංචිකාරියක වූ අතර ඇය පල්ලේකැලේ (නුවර) ගුරු මෑණියෙකු යටතේ පැවිදි භාවය ලබා ඇත. මේ අනුව මොවුන් සියලු දෙනා ම පාහේ තමා පදිංචි ප්‍රදේශය තුළ ඇති ආරාමයක ගුරු මෑණියෙකු යටතේ පැවිදිභාවය ලැබූවන් බව හඳුනාගත හැකි විය.

ආරාමික ජීවිතය තුළදී යම් යම් නීති රීති මධ්‍යයේ ආගමික ශික්ෂණයකින් කටයුතු කිරීම සිදුවේ. උදාහරණයක් වශයෙන් අනුරාධපුරය සංඝමිත්තා ආරාමයේ ප්‍රධාන දසසිල් මාතාවගේ අදහස් දැක්වීම අනුව ආරාමික

දසසිල්මාතාවෝ අළුයම 4.00 ට අවදි වන අතර රාත්‍රී 10.00 ට නින්දට යති. මේ අතරතුර කාලයේදී විවිධ කාර්යයන් ඔව්හු ඉටු කරති. සුද්ද පවිත්‍ර කිරීම්, ගුරු මෑණිවරුන්ට උපස්ථාන කිරීම්, ආහාර පිළියෙල කිරීම්, ආගමික වතාවත් සිදු කිරීම්, බණ පොත් කියවීම්, ආදී සියලු කටයුතු ඒ අතර වේ. මෙපරිදි ගෙවී යන ආරාමික ජීවිතය තුළ යම් ඒකාකාරී ස්වභාවයක් පවතී. පූජා භූමිය ආශ්‍රිත සිටින සිල් මෑණිවරුන් ද එවැනි ජීවිතයක් ගෙවා විවිධ හේතූන් පදනම් කොට ගෙන පූජා භූමියට යොමු වූවන් වශයෙන් හඳුනාගත හැක.

සුමනා සිල්මාතාව ප්‍රකාශ කළ පරිදි ආරාමික ජීවිතයේ දී දානමය ආරාධනා, ධර්ම දේශනා, පිරිත් පිංකම් සඳහා සම්බන්ධ වීමේ අවස්ථාවේ ලැබූ නමුත් පූජා භූමියට යොමු වීමත් සමඟ එවැනි අවස්ථා අහිමි ව ගොස් ඇත. මේ අනුව ආරාමික ජීවිතය තුළ පවතින ජීවන රටාව පූජා භූමියට පැමිණීමත් සමඟ අහිමි වී ගිය ආකාරය පැහැදිලි ය. එසේ ම ආරාමික ව සිටිය දී හිමි වූ සමාජ වරප්‍රසාද, සමාජ ගරුත්වය පූජා භූමියට පැමිණීමත් සමඟ දුරස්ථ වී ගිය ආකාරය ද පැහැදිලි ව හඳුනාගත හැක. එසේ ම ආයතනගත හා ආයතනගත නොවූ වශයෙන් පැහැදිලි විභේදනයක් මොවුන්ගෙන් විද්‍යමාන වේ. ආරාමික ජීවිතය හරහා ගොඩනගා ගත් ශික්ෂණය ඇගයුම් හා වටිනාකම් මත නිර්මාණය වී ඇති මෙම සිල්මෑණිවරුන්ගේ ජීවිතය පූජා භූමි ආශ්‍රිත ජීවිතයට යොමු කරමින් ආන්තික තත්වයකට පත්වීමේ වරද පූර්ණ වශයෙන් ඔවුන්ට ම පවරා නිදහස් වීමට නොහැක. මන්ද ඔවුන් එවැනි කටුක ඉරණමකට ඇද දැමීමට පාදක වූ සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලන සාධක සමාජයෙන් ම හඳුනාගත හැකි බැවිනි.

## ආරාමික ජීවිතයෙන් ඉවත් වීම

ආරාමික ජීවිතය තුළ පවතින ශික්ෂණය, විනය, නීති රීති පදනම් කොට ගෙන ආයතනික ජීවිතය උසස් තත්ත්වයක් වශයෙනුත් පූජා භූමි ආශ්‍රිත ස්ථිර වාසස්ථාන නොමැති ව ගත කරන ජීවිතය පහත්, චීවරයේ උත්තරීතර තත්වය හා ආරාමික දස සිල් මාතාවන්ගේ හෝ භික්ෂුණීන්ගේ පරමාදර්ශි භූමිකාවට නිගාකරන තත්ත්වයක් වශයෙනුත් සංජානනය කර ගන්නා සමාජය ඒ අනුව මොවුන්ගේ පරමාදර්ශී ජීවිතයේ උස් මිටිකම් සොයා බැලීමට උත්සාහ දැරීම සිදුවේ. නමුත්, මොවුන් ආරාමික ජීවිතයෙන් ඉවත් ව මෙවැනි අනාරක්ෂිත තත්ත්ව මධ්‍යයේ කටයුතු කිරීමට යොමු වීමට හේතු කාරක වූ තත්ත්ව සොයා බැලීමට සමාජය උත්සුක නොවේ. මේ නිසා මෙවැනි තත්ත්වයකට ඔවුන් ඇද දැමූ පසුබිම් කරුණු හඳුනා ගැනීම වැදගත් ය.

වජිරා සිල්මෑණියන්ගේ ප්‍රත්‍යක්ෂයෙන් පැහැදිලි කරන පරිදි ගුරු මෑණියන් සිරිපාදේ ආරාමයට යාමත් සමඟ ගෝල සිල්මෑණිවරුන් විසින් ඔවුන් සිටි ආරාමය විකුණා දැමීම නිසා උන්හිටි තැන් අහිමි වූ වජිරා සිල්මෑණියන් කතරගම බස් නැවතුම් පොළක වසරක් ගත කොට ඇත. නමුත් එහිදී විශාල ප්‍රශ්න රැසකට මුහුණ දීමට තමාට සිදු වූ බවත් චීවරය ගැනවත් නොසිතා බොහෝ පිරිසක් තමාට අතවර කිරීමට උත්සාහ දැරීම හා බස් නැවතුම් පොළින් පන්නා දැමීමට කටයුතු කිරීම නිසා අනුරාධපුර පූජා භූමියට පැමිණී බවත් ප්‍රකාශ කළා ය. ඇය තවදුරටත් ප්‍රකාශ කළේ, "චීවරයක් දාගෙනවත්

අද තනියම ජීවත්වෙන්න කාන්තාවකට බෑ. ඒ තරමට සමාජෙ දූෂණය වෙලා. මේ පූජා භූමියේ මම වගේම ගොඩක් අය ඉන්න නිසා ආරක්ෂාවට ප්‍රශ්නයක් නෑ" වශයෙනි (වජිරා සිල්මාතාවː 2010.04.18 දින සම්මුඛ සාකච්ඡාව සඳහා ගතකරන ලද කාලය පැය 02යි).

තව ද සුමනා මෑණියගේ අදහසට අනුව ආරාමික ජීවිතය ඇතැම් විට ඉතා කටුක ය. එය ඇගේ ම අදහසට අනුව පැහැදිලි කර ගත හොත්, "මුල් කාලයේදී ගුරු මෑණියෝ හරිම හොඳයි. ගෝල මෑණිවරුන්ට අවවාද අනුශාසනා දෙමින් සහයෝගයෙන් ඉන්නවා. නමුත් පස්සේ පස්සේ හරියට නැන්දම්මයි ලේලියි වගේ. මොනවා කරත් හොඳක් නෑ. හැම වෙලේම රණ්ඩු කරනවා" (සුමනා සිල්මාතාවː 2010.06.20 දින සම්මුඛ සාකච්ඡාව සඳහා ගත කරන ලද කාලය පැය 01 වි. 30යි). මෙය එක්තරා දුරකට කෙලෙස් ප්‍රහීණ නො කිරීම නිසා ඇති වූ තත්ත්වයකි. එසේ ම මෙත්තා සිල්මෑණිය ප්‍රකාශ කළ පරිදි ඇය ගුරු මෑණියගේ ආරාමයේ පදිංචිව සිට ඇය අපවත් වීමත් සමඟ ආරාමය තුළ නායකත්වය පිළිබඳ එකිනෙකා කුලල් කන තත්වයක් වර්ධනය වීම හේතුකොට ගෙන ආරාමයෙන් බැහැර ව ජීවත් වීමට යොමු වී ඇත. ඥාණසීය සිල්මෑණියගේ පැහැදිලි කිරීම ඉහත පැහැදිලි කිරීම්වලට වඩා සුවිශේෂත්වයක් උසුලයි. ඇය ප්‍රකාශ කළ පරිදි,

> "මම කළුතර ඉඳලා අනුරාධපුරයට ආවේ සංඝමිත්තා ආරාමයේ බෝධි පූජා තියන්න කෙනෙක් නෑ කියලා කරපු ආරාධනාවකට. නමුත්, බැතිමතුන් අතර ටික ටික මම ජනප්‍රිය වෙද්දී ආරාමේ කට්ටිය ඒකට ඊර්ෂ්‍යා කළා. දිනක් මට කථා කරලා ආරාමේ ලොකු මෑණියෝ කිව්වා ආරාමේ පිටුපස කාමරයට යන්න, නැත්නම් මගේ බඩු මූට්ටු එළියට දානවා කියලා. මම ඒකට විරුද්ධ වුනා. පස්සේ මම ආරාමෙන් පිටතට ගිහින් එනකොට මගේ බඩු මූට්ටු ඔක්කොම එළියට දාලා තිබුණා. දැනට මම කුලියට ගත්ත කාමරයක ඉන්නේ. ඒකට මාසයකට රුපියල් දාහක් ගෙවනවා. එහෙ ඉඳලා තමයි පූජා භූමියට එන්නේ" (ඥාණසීය සිල්මාතාවː 2010.06.19 දින සම්මුඛ සාකච්ඡාව සඳහා ගත කරන ලද කාලය පැය 02 යි).

නමුත් මේ පිළිබඳ අදහස් දැක්වූ සංඝමිත්තා ආරාමයේ දසසිල්මාතාවන් එය තම ආරාමයට කැළලක් කිරීමට ගෙතුවක් වශයෙන් බැහැර කරන ලදී. එසේ වුව ද ආරාම තුළ පවතින අභ්‍යන්තර ගැටුම්කාරී වාතාවරණය පැහැදිලි කිරීමේදී මෙය වැදගත් වේ. එකිනෙකාට ඊර්ෂ්‍යාසහගත වෙමින් ප්‍රචණ්ඩකාරී ව හැසිරීම තුළ ඔවුහු තව දුරටත් ගිහි භූමිකාවක් රඟ දක්වති. මෙම සිල්මෑණිවරුන් පැවිදි දිවියට එළඹීමේදී ලෝකෝත්තර විමුක්තියක් අපේක්ෂා කරන ලද නමුත් ඊට අවශ්‍ය මාර්ගයේ ගමන් නොකිරීම ගැටලුසහගත ය.

## පූජා භූමියට පැමිණීම සහ දෛනික අවශ්‍යතා සාධනය

උක්ත කරුණු අනුව පැහැදිලි වන්නේ පූජා භූමියට බොහෝමයක් සිල්මෑණිවරුන් පැමිණ සිටින්නේ අහඹු හේතු නිසා නොවන බව ය. එමෙන් ම ඔවුන් එහි ගත කරන්නේ ඉතා සැපවත් ජීවිත නොවේ. මන්දයත්, පූජා භූමිය තුළ දීර්ඝකාලයක්

රැඳී සිටින සිල්මෑණිවරුන් සිය මූලික අවශ්‍යතා තෘප්තිමත් කරගැනීමේදී විවිධ දුෂ්කරතාවන්ට මුහුණ පාන බැවිනි. බර්තෝලමියුස්(1994: 191-192) සිය අධ්‍යයනය හරහා ද පැහැදිලි කරන පරිදි පූජා භූමිය ආශ්‍රිත ව ජීවත් වූ ධර්මශීලා නම් එක් සිල්මාතාවක පූජා භූමිය තුළ දුෂ්කර ජීවිතයක් ගත කරන ලද්දේ පරණ සිවුරු වටකොට නිවහනක් සකසා ගනිමින්, මහජන වැසිකිළිය ද ස්නානය සඳහා අනුරාධපුරයේ තිබූ පැරණි වැවක් ද භාවිත කරමිනි. තව ද අනුරාධපුර ප්‍රදේශය තුළ පවතින වියළි දේශගුණික තත්වය ද මොවුන්ට මෙම ස්ථානය තුළ දීර්ඝ කාලීන ව රැඳී සිටීමට හැකි පරිදි නිර්මාණය වී පවතී. විශේෂයෙන් පූජා භූමිය තුළ පවතින විශාල අතු විහිදී ගිය ගස් යට අව් වැසි නොතකා වාසය කිරීමට ඔවුන් පුරුදුව සිටී.

ඉහත කී තත්ත්ව මෙම අධ්‍යයනය තුළ දී ද හඳුනා ගත හැක විය. වජිරා සිල්මාතාව මහ මෙවුනා පරිශ්‍රය තුළ පොල් අතු, තල් අතු සහ ලෑලි කැබලි හරස් කොට ගෙන ජීවත් වීමට තාවකාලික වාසස්ථානයක් නිර්මාණය කොට ගෙන තිබුණි. එහි ඇතුළත පොළෝ මට්ටමින් අඩියක් පමණ උස් ව සිටින සේ මැටි යහනාවක් සකසා ඒ මත ඉටිරෙදි එළා තිබුණි. මෙම ප්‍රදේශය අවට ඉතා අපිරිසිදු තත්ත්වයක් දිස් වූ අතර වළං කැබලි, කෑම එතූ කොළ කැබලි හා සතුන් සඳහා කෑම දැමූ කොළ කැබලි තැන තැන දමා තිබුණි. වැසි දිනක එම කුටිය අසලට ගිය විට දැකගත හැකි වූයේ ඇය ඉටි කොළයක් මත වාඩි වී කුඩයක් ඉහළාගෙන තෙමී තෙමී සිටිනා ආකාරය යි. වැසි සමයේදී තාවකාලික කුටිය තෙමෙන බැවින් රාත්‍රී කාලය ගත කරන්නේ කෙසේ දැයි විමසූ විට ඇය ප්‍රකාශ කළේ,

> "වැසි කාලය කියලා මට යන්න තැනක් නෑ. කුටියෙන් පිටත ඉටි කොළයක් එළාගෙන ඒකෙ නිදාගෙන ඉටිරෙද්දක් පොරවා ගෙන කුඩයක් ඉහළා ගන්නවා. මොනව කරන්නද අපිට ආරාම හදලා දෙන්න කවුරුත් ඉදිරිපත් වෙන්නෙ නෑනෙ. මේක අපේ කරුමෙ තමයි" වශයෙනි (වජිරා සිල්මාතාව: 2010.06.18 දින සම්මුඛ සාකච්ඡාව සඳහා ගතකරන ලද කාලය පැය 02යි).

ඇය ගත කරන කටුක ජීවිතය මින් අවබෝධ කරගත හැක. එසේම ඇය ආහාර අවශ්‍යතාවය සපුරා ගැනීම පිළිබඳ දැක් වූ අදහස වූයේ,

> "මෙහෙට එන බැතිමත්තු සමහර දවස්වලට කෑම පාර්සල් ගෙනත් දෙනවා. සල්ලි දීලා ගියොත් කඩෙන් කෑම එකක් ගෙනත් කනවා. නැතිම දවසක් වුනොත් ගමේ ඇවිදලා මොනවා හරි හොයාගෙන ඇවිත් රත් කරගන්නවා" වශයෙනි (වජිරා සිල්මාතාව: 2010.04.18 දින සම්මුඛ සාකච්ඡාව සඳහා ගතකරන ලද කාලය පැය 02යි).

සෙසු සිල්මෑණිවරු ද මේ හා සමාන ම අදහස් දැක්වූහ. උත්තරා සිල්මෑණිය ප්‍රකාශ කළේ නිදා ගැනීම සඳහා දෛනික ව රුපියල් 30 ක මුදලක් ගෙවා පුෂ්පදානයට යන බවයි. ධම්මිකා සිල්මෑණිය ප්‍රකාශ කළේ තමා මල්වතු ලේන් එකේ මැටි ගැසූ කුටියක ජීවත් වන බවයි. ඇයට එම කුටිය සකස්කර දී ඇත්තේ පල්ලෙකැලේ ආරාමයේ සිටි කාලයේ දී උපකාර කළ දායකයන් දෙදෙනෙකු විසිනි. ඇය උදේ ම අවදි වී ආහාර පිස, උදේ ආහාරය ගැනීමෙන්

අනතුරු ව පූජා භූමියට පැමිණෙන බවත් නැවත දවල් ආහාරය සඳහා කුටියට යන බවත් ප්‍රකාශ කළා ය. එසේ ම රෝගාතුර තත්වයකින් සිටින අවස්ථාවලදී රජයේ රෝහලට ගොස් ප්‍රතිකාර ලබා ගන්නා බව ද ඇය ප්‍රකාශ කළා ය. එසේම මොවුන්ගේ අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා අවශ්‍ය මුදල් සොයා ගන්නා ආකාරය පිළිබඳ විමසූ විට බේමා සිල්මෑණිය ප්‍රකාශ කළේ තමා පිං පඩියක් ලබන බවත්, බැතිමතුන්ගෙන් ලැබෙන ආධාර උපකාරයන්, පිංපඩියෙන් ලැබෙන මුදලත් තමාට ජීවත් වීමට ප්‍රමාණවත් බවත් ය. බේමා සිල්මෑණිය දැක් වූ පරිදි ඇය ස්නානය සඳහා බසවක්කුලම වැවට හෝ බෞද්ධ මන්දිරයේ ළිඳට යාමට පුරුදුව සිටී. පූජා භූමියට වැඩිපුර සෙනග පැමිණෙන දිනවල දී ඇය ආරම්භක ව සිටි කාලයේ උපකාර කළ දායකයෙකුගේ නිවසකට ගොස් දින කිහිපයක් ගතකොට නැවත පූජා භූමියට පැමිණේ.

ඥාණසීය සිල්මෑණිය දැක්වූ පරිදි ඇය කුළියට ගත් නිවසක වාසය කරන අතර ආහාර ද සකසාගනී. එසේ ම ඇය ලවා බෝධිපූජා පවත්වා ගැනීමට එන බැතිමතුන් ඒ සඳහා ලබාදෙන තුටු පඩුරු හා ද්‍රව්‍යමය උපකාර ද ජීවිතය පවත්වා ගැනීමේ දී උපකාරී වන බව ඇය තවදුරටත් ප්‍රකාශ කළා ය. මොවුන්ගේ, අදහස් දැක්වීම්වලට අනුව මූලික අවශ්‍යතා සාධනය කර ගැනීමේ දී පොදු ළිං, වැසිකිළි, වැව්, ධර්මශාලා, දාන ශාලා ආදිය යොදාගන්නා බව පැහැදිලි ය. විශේෂයෙන් සතුටුදායක ආර්ථික මට්ටමක් පවතින පිරිස් තම පෞද්ගලික වියදමින් කුළී නිවෙස් තුළ ගත කිරීමට යොමුවීමක් ද මෙහි දී හඳුනාගත හැකිවිය.

කෙසේ නමුදු, මෙවැනි පොදු ස්ථාන භාවිත කිරීමේ දී මොවුන් අතර ගැටුම් ඇතිවන අවස්ථා හඳුනාගත හැකිවිය. විශේෂයෙන් වජිරා සිල්මෑණියගේ කුටිය අසල සුදු පැහැ වස්ත්‍ර හැඳි උපාසිකාවක් ද වාසය කරන අතර ඇය ප්‍රකාශ කළේ වජිරා සිල්මෑණිය ඇයගේ බඩු භාණ්ඩ පවා සොරකම් කරන බවත් ඇතැම් අවස්ථාවල දී පහරදීම් සඳහා ද යොමු වන බවත් ය. මේ අනුව මෙම සිල්මෑණිවරුන් මූලික අවශ්‍යතා සාධනය කර ගැනීමේ දී විශාල ප්‍රශ්න රැසක් හමුවේ කටයුතු කරන ආකාරය පැහැදිලි ය. කෙසේ නමුත්, එම බාධාකාරී වාතාවරණ මධ්‍යයේ වුව ද චීවරය අත් නොහැර සිටින්නේ ඔවුන්ට වෙනත් විකල්පයක් නොමැති බැවිනි. මූලික වශයෙන් මොවුන්ගේ පැවැත්ම චීවරය මත පදනම් වීම මීට හේතුවයි.

## සිල්මාතාවන්ගේ දෛනික කෘත්‍යයන්

ගිහි පැවිදි අතරමැදි තත්ත්වයක් නිරූපණය කරන මෙම සිල්මෑණිවරුන්ගේ දෛනික කෘත්‍යයන් ද ආගමික සහ ආගමික නොවන කෘත්‍යයන් ලෙස වර්ග වේ. මෙම සිල්මෑණිවරුන් පූජා භූමිය ආශ්‍රිත ව ජීවත් වෙමින් සිදුකරන ආගමික කාර්යභාරය හඳුනාගැනීම මෙහිදී සිදුවේ. බේමා සිල්මෑණිය සඳහන් කළ පරිදි ඇය තමන්ට හැකි පරිදි හැකි අවස්ථාවලදී ශ්‍රී මහා බෝධියට කිරි ආහාර පූජා කිරීම, තේ, ගිලන්පස පූජා කිරීම ආදී ආගමික වතාවත්වල නිරත වේ. සුමනා සිල්මාතාව පැවසූ පරිදි ඇය හැකි අවස්ථාවලදී පූජා භූමිය ආසන්නයේ පවතින සේනාසනවලට ගොස් බණ භාවනා කිරීම්වලට සම්බන්ධ වී කටයුතු කරයි. මෙයින් පැහැදිලි වන්නේ ඇය නිතර පූජා භූමිය තුළ රැඳී සිටිය ද එතැන

පවතින වාතාවරණය ඇයගේ ආගමික පරමාදර්ශය ළඟා කර ගැනීමට බාධාවක් බවයි. මේ නිසා නිදහස් පරිසරයක පිහිටි සේනාසන වෙත යොමු වී ආගමික කටයුතු කිරීමට ඇය පෙළඹී ඇත.

සුමනා සිල්මෑණියය පැවසූ පරිදි ඇය පූජා භූමියට පැමිණෙන බැතිමතුන් පංච ශීලයෙහි පිහිටු වීම, බෝධි පූජා පැවැත්වීම ආදිය සඳහා සම්බන්ධ වේ. බෝධි පූජා පැවැත්වීමට ඈ තුළ පවතින හැකියාව සහ සිල්වත් බව නිසා පූජා භූමියේ සිටින ආරක්ෂක නිලධාරීහු පවා බෝධිපූජා පවත්වා ගැනීමට එන බැතිමත්හු ඇය වෙතට එවීමට කටයුතු කරති. මොවුන්ගේ දෛනික ආගමික කෘත්‍ය පිළිබඳ කතා විමසීමේදී ඥාණසීය සිල්මෑණියගේ අදහස් ඇක්වීම් ද ඉතා වැදගත් වේ. බෝධි පූජා පැවැත්වීම කෙනෙකු නොමැති වීම නිසා සංඝමිත්තා ආරාමයේ පැවැති අඩුව පිරවීම සඳහා අනුරාධපුරයට පැමිණෙන ඇය ආරාමයෙන් බැහැරවී ජීවත් වූව ද එම කාර්යය අත් නොහැර පවත්වා ගෙන ගොස් ඇත. මේ හරහා ඇය එම කාර්ය සඳහා හොඳ සමාජ ඉල්ලුමක් ගොඩ නඟා ගෙන ඇති ආකාරය පැහැදිලි වේ. ඇය, තමන් නිතර පූජා භූමිය තුළ නොරැඳෙන බවත් තම දුරකථනයට ලැබෙන කෙටි දැනුම්දීමකින් නැතහොත් කල්තියා කළ ආරාධනයක් අනුව, හෝ බැතිමතුන් තම කුටියට තමන් සොයා පැමිණීම හේතු කොට ගෙන ඔවුන්ගේ අවශ්‍යතාවය ඉටුකිරීමට පූජා භූමියට පැමිණෙන බව සඳහන් කළා ය. මෙය ඇයගේ ජීවනෝපායන මාර්ගය වශයෙන් ද හඳුනාගත හැක. ඇය ප්‍රකාශ කළ පරිදි,

> "බෝධිපූජා තියන්න මාව හොයන් එන බැතිමතුන් මගේ සේවය පිළිබඳව අගය කරලා කරන යම් යම් ද්‍රව්‍යමය හෝ මූල්‍යමය උපකාර නිසා කරදරයක් නැතිව මට ජීවත් වෙන්න පුළුවන්. ඒවයින් තමයි ජීවත් වෙන්න උවමනා දේවල් මම හොයා ගන්නෙ" (ඥාණසීය සිල්මාතාවඃ 2010.06.19 දින සම්මුඛ සාකච්ඡාව සඳහා ගත කරන ලද කාලය පැය 02 ය).

තවද ක්ෂේත්‍ර අධ්‍යයනය තුළදී හඳුනාගත හැකි වූයේ මොවුන් අතරින් කිහිපදෙනෙකු පූජා භූමියට පැමිණි පසු ශ්‍රී මහා බෝධිය, රුවන්වැලි සෑය වන්දනාමාන කිරීමට යොමුවන බවයි. මොවුන් අතර සිටින බහුතරයකට ආගමික කරුණු පිළිබඳ පවතින දැනුම අවම මට්ටමක පවතින බව ද අධ්‍යයනයෙන් හෙළි වූ කරුණකි.

ආගමික නොවන කෘත්‍යයන්හී ද සිල්මාතාවන් නියැළෙන ආකාරය බහුල වශයෙන් දක්නට වූ තත්ත්වයකි. පූජා භූමිය ආශ්‍රිත මෙම සිල්මෑණිවරුන් පැවිදි පරමාදර්ශයක් ළඟා කර ගැනීමට වඩා එදිනෙදා දිවිය පවත්වාගෙන යාමේ යාචක ක්‍රියාකාරකම්හි නිරත වන බව හඳුනාගත හැකි විය. විශේෂයෙන් එකිනෙකා පරයමින් බැතිමතුන් ලබාදෙන මූල්‍යමය හෝ ද්‍රව්‍යමය වරප්‍රසාද තමා සතුකර ගැනීමට ආවේගශීලීව කටයුතු කරන ආකාරය දක්නට විය. ඇතැම් අවස්ථාවන්හී දී බැතිමතුන් දුන් දාන ලබා ගැනීමට සුදුවත් හැඳි උපාසිකාවන් හා සිල්මෑණිවරුන් අතර ගැටුම්කාරී තත්ත්ව ඇතිවෙ. එහිදී ඔවුහු තමන් චීවරධාරී පැවිදි කාන්තාවන් යන්න පවා අමතක කොට දමා, ගිහි කාන්තාවක මෙන් ගැටුමට යොමු වීම, චීවරධාරිණියකගෙන් බලාපොරොත්තු

විය නොහැකි තත්ත්වයකි. යැපීම මූලික පරමාර්ථය කොටගත් මොවුන්ගෙන් මෙවැනි තත්ත්ව දෘශ්‍යමානවීම අසාමාන්‍ය නොවන්නේ, මූලික අවශ්‍යතා පවා ඉතා අපහසුවෙන් ඉටුකරගන්නා පිරිසක් යමක් තමා සතු කරගැනීමේ දී ආවේගශීලී ව හා ආක්‍රමණශීලී ව කටයුතු කිරීම ප්‍රායෝගික සමාජය තුළ ද දැකිය හැකි පොදු ධර්මතාවක් වන හෙයිනි. මෙහිදී තත්වය, නම්බුව, සමාජ අපවාද ආදියට වඩා ජීවත්වීම වැදගත් කොට සලකයි. මූලික අවශ්‍යතාවන් පවා අහිමි වී යාම පුද්ගල චර්යාව පරිවර්තනය කිරීමෙහි ලා සෘජු බලපෑමක් එල්ල කරයි.

ආයතනගත දසසිල්මාතාවන්, භික්ෂූන් වහන්සේලා සහ බැතිමතුන්ගේ අදහස අනුව මොවුන් යාචක වෘත්තියේ නියැලෙන පිරිසකි. විශේෂයෙන් ම සතියේ දිනවලදී, සති අන්ත දිනවලදී සහ පොහොය දිනවලදී සිල්මෑණිවරු ශ්‍රී මහා බෝධි පිවිසුම් මාර්ගය දෙපස සිටිමින් වන්දනාමාන සඳහා පූජා භූමියට පැමිණෙන බැතිමතුන්ගෙන් යමක් ඉල්ලා ගැනීමට කටයුතු කරති. එසේ නොමැති අවස්ථාවල බැතිමතුන් පිටුපස යමින් යමක් ඉල්ලා ගැනීමට කටයුතු කරන අතර ඇතැම් අවස්ථාවලදී චීවරයක්, බෝ ගසක අනුරුවක්, පාත්තරයක් හෝ බුදු පිළිමයක් අතැතිව විවිධ පූජාවන් සඳහා ආධාර එකතු කරන මුවාවෙන් බැතිමතුන් නොමඟ යවමින් මුදල් උපයා ගැනීමට උත්සාහ කරන ආකාරයක් ද හඳුනාගත හැකි විය. උදෑසනින් පූජාභූමියට පැමිණ සෙවන සහිත ගසක් යට ඉටි රෙද්දක් එලාගෙන පූජා භූමිය තුළ රැඳෙන මොවුන් බැතිමතෙකු දුටු විට යාචකයන් ලෙස හඬ නගා යමක් ඉල්ලා සිටීමට පෙළඹෙන අවස්ථා ද දැකගත හැක. ඇතැම් අවස්ථාවල ඔවුන්ට නොදී සුදු හැඳගත් උපාසිකාවන්ට යමක් දුන් විට එම පුද්ගලයාට බැණවැදීමට තරම් ආවේගශීලි වන අවස්ථා ක්ෂේත්‍ර අධ්‍යයන තුළ දී හමුවිය. ජීවත්වීම සඳහා අරගලයක නියුතු මොවිහු පැහැදිලිව ම යාචක භූමිකාවක් රඟ දක්වන බව මේ අනුව සඳහන් කළ හැක.

එසේම සොරකම, ගැටුම්කාරීව හැසිරීම මෙන් ම අනාචාරයේ යෙදීම සම්බන්ධයෙන් ද කරුණු වාර්තා විය. වජිරා සිල්මාතාව පිළිබඳ ව අදහස් දැක්වූ පොලිස් නිලධාරියෙකු මෙන් ම, සුදු හැඳගත් උපාසිකාවක ප්‍රකාශ කළේ ඇයගේ චරිතය යහපත් නොවන බවයි. අන් සතු දේ සොරකම් කරමින් නිතර අඬදබරවලට යොමු වීම මෙන් ම පුරුෂ පක්ෂය සමඟ පවත්වන අයථා සම්බන්ධතා පිළිබඳව ද තොරතුරු ඔවුහු ප්‍රකාශ කළහ. ජීවත්වීමට විකල්ප නොවූ කල්හී ස්ත්‍රීයකට පැවිදි සිවුර පවා භාවිත කිරීමට සිදුවීම ඛේදනීය තත්ත්වයකි. වජිරා සිල්මාතාව ප්‍රකාශ කළේ තමා මීට පෙර වාසය කළ කුටිය කුප්පි ලාම්පුවක් පෙරළී ගිනිගත් බවත් තමා දැනට සිටින තවාතැන්පළ ඉන් පසුව සකසාගත් බවත් ය. එහෙත් ඉහත උපාසිකාව හා පොලිස් නිළධාරියෝ පැහැදිලි කළ පරිදි අයහපත් හැසිරීම නිසා ඇය පූජා භූමියෙන් පළවා හැරීමට පොලිස් නිළධාරීන් විසින් එම කුටිය පුළුස්සා දමා ඇත. කෙසේ නමුත්, ඇයගේ හැසිරීම චීවරධාරිණියකට සහ පැවිදි වෘතයට යෝග්‍ය නොවීම මේ සියලු ගැටලුවලට හේතුව ඇති බව ද ගම්‍ය වේ.

මීට අමතර වශයෙන් පූජා භූමියට පැමිණෙන බැතිමතුන්ගේ පාවහන් බඩු බාහිරාදිය සුරැකිව තබා ගනිමින් ඒ වෙනුවෙන් යම් මුදලක් අය කරගැනීමට ඇතැම් සිල්මාතාවන් කටයුතු කරන ආකාරය දක්නට විය. එම කාර්ය උදෙසා බැතිමතුන්ගෙන් යම් මුදලක් බොහෝ විට හිමි වේ. විශේෂයෙන් බැතිමතුන්

පසු පස යමින් වෙහෙසවීමට තරම් යහපත් සෞඛ්‍ය තත්ත්වයක් නොමැති පිරිස මෙම කාර්යයේ නිරතවීම ද මෙහිදී හඳුනාගත හැකි වූ තත්ත්වයකි. එමෙන් ම යැපීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය මූල්‍යමය හෝ ද්‍රව්‍යමය සම්පත් උපයා ගැනීමට ඔවුන් උපක්‍රමශීලීව කයටුතු කරන අවස්ථා ද පවතී. බැතිමතුන් සමඟ පැමිණෙන කුඩා දරුවන් තමන් වෙත ආකර්ෂණය කරගැනීම හරහා යමක් ලබා ගැනීමට උත්සාහ කරමින් කුඩා දරුවන්ට ඉතා ආදරයෙන් ඇමතීමට පෙළඹෙති. ඇතැම් අවස්ථාවලදී මෙම සිල්මෑණිවරු සහ උපාසිකාවෝ සංවිධානාත්මක ව කටයුතු කරති. එක් අවස්ථාවකදී බැතිමතුන් ලබා දුන් දානයක් ලැබූ උපාසිකාවක් අනෙක් පිරිස ද දැනුවත් කොට දානය ලබා දෙන ස්ථානයට ඔවුන් යොමු කිරීමට කටයුතු කළ ආකාරය අනුව අඩ දබර ඇති කර ගත්ත ද එකම සමාජ මට්ටමක් නියෝජනය කරන පිරිසක් වශයෙන් තම කණ්ඩායම ගැන සිතා කටයුතු කිරීමට ද මොවුන් ක්‍රියාත්මක වන ආකාරය මෙහි දී පැහැදිලි වූ කරුණකි.

මේ අනුව ආගමික පරමාදර්ශී චර්යා රටාවන්ගෙන් පරි බාහිර ව යැපීම අරමුණු කොටගත් යාචක ක්‍රියාවලියක නිරතවෙමින් කටයුතු කරන පිරිසක් වශයෙන් පූජා භූමි ආශ්‍රිත සිල්මෑණිවරුන් හඳුනාගත හැක. මේ නිසා මොවුන් තම පැවිදිභාවය තුළ ආධ්‍යාත්මික දියුණුව හරහා පැවිදි පරමාදර්ශයක් ගොඩනගා ගැනීමට වඩා එදිනෙදා ජීවිතය පවත්වා ගෙනයාම උදෙසා කටයුතු කරන බව ද ප්‍රකාශ කළ හැක. චීවරය ඔවුන්ගේ පැවැත්ම තහවුරු කිරීමේ සංකේතයක් වශයෙනුත්, අනන්‍යතාව ගොඩනගා ගැනීමේ මාධ්‍යයක් වශයෙනුත් භාවිත කරන ආකාරය මේ හරහා ගම්‍යවේ. මේ අනුව ඔවුන් අතරින් බොහෝ දෙනෙකුගේ පැවිදිභාවය හුදු චීවරයට පමණක් සීමාවූවක් බව පැහැදිලි ය.

## දුෂ්කරතා සහ අභියෝග

ස්ථිර වාසස්ථානයක් නොමැති ව, කාලගුණික හා දේශගුණික විපර්යාස නොතකා පූජා භූමිය තුළ දීර්ඝකාලීන ව රැඳී සිටීම තුළ සිල්මාතාවන් ගත කරන දුෂ්කර ජීවිතය සැබැවින් ම ඛේදනීය ඉරණමකට මුහුණ පෑමකි. මූලික අවශ්‍යතා පවා ඉතා අපහසුවෙන් සපයා ගන්නා මොව්හු ජීවිතය පවත්වාගෙන යාමේ දී අභියෝග රැසකට මුහුණ පාති. බර්තෝලමියුස් (1994: 192) දක්වන ආකාරයට මෙම පූජා භූමි ආශ්‍රිතව සිටින පැවිදි කාන්තාවන් එම ස්ථානවලින් පළවා හැරීමට බලධාරීන් උත්සාහ දරා ඇත. අටමස්ථාන භාරකාරත්වය දරණ විහාරස්ථානයේ (ශ්‍රී මහා බෝධි පරිශ්‍රයේ පිහිටි විහාරයේ) ස්වාමීන් වහන්සේ නමක් ප්‍රකාශ කළේ අටමස්ථානාධිපති හිමියන් එවැනි පිරිස් පූජා භූමියේ රැඳී සිටීමටත්, යාචක වෘත්තියේ නියැළීමටත් විරුද්ධත්වයක් දක්වන බවයි. මේ නිසා ආරක්ෂක නිලධාරීන් හරහා ඔවුන් පූජා භූමියෙන් ඉවත් කිරීමට බොහෝ අවස්ථාවන්හිදී කටයුතු කර ඇත. එම ස්වාමීන් වහන්සේ විසින් මෙම සිල් මෑණිවරුන්ගේ පැවැත්මට සිදුකරන බලපෑම පිළිබඳ ආවේගශීලී ව අදහස් දැක් වූ උත්තරා සිල්මෑණිය ප්‍රකාශ කළේ;

> "හාමුදුරුවන්ට හොඳයි අර ආධාරයයි, මේ ආධාරයයි කියලා ප්‍රචාරණය කරලා සල්ලි හොයන්න. අපිට බැතිමතෙක් සතුටින් දෙන දෙයක් ගන්න හොඳ නෑ. ඒක හරි අසාධාරණයි. එයාලා වගේ සැප විඳින්න

නොවෙයි, අපි කීයක් හරි හොයාගන්නේ ජීවිතේ ගැටගහගෙන යන්න" වශයෙනි (උත්තරා සිල්මාතාවः 2010.06.05 දින සම්මුඛ සාකච්ඡාව සඳහා ගත කරන ලද කාලය පැය 01 වි. 15යි).

ඛේමා සිල්මැණියට අනුව පූජාභූමිය තුළ ආරක්ෂාවට තර්ජනයක් නොමැති නිසා ජීවිතය ගැටගසා ගැනීම පමණක් දුෂ්කරතාවක් ව පවතී. ඇය ප්‍රකාශ කළ පරිදි ඇතැම් දිනයන්හි මුදල් අඟහිඟකම් ඇති වූ විට නිරාහාර ව සිටීමට පවා සිදුවන අවස්ථා ඇත. මේ නිසා ජීවිතය නොනැසී පවත්වාගෙන යාම පවා ඇයට දුෂ්කර ක්‍රියාවකි. එසේ ම සුමනා සිල්මැණිය ප්‍රකාශ කළේ, මෙවැනි පිරිසක් සමඟ කටයුතු කරන විට ඇතැම් අවස්ථාවල සිත් රිදීම්, සොරමැරකම්, කපටිකම් ආදියට මුහුණ දෙමින් දිගු කාලීන ව එකට කටයුතු කිරීම අභියෝගයක් බවයි. නමුත්, නිසි වාසස්ථානයක් නොමැති ව පොදු ස්ථානයක ජීවත් වන විට විශේෂයෙන් රාත්‍රී කාලය ගතකිරීමේදී හුදෙකලාව සිටීම ගැටලුවකි. මේ නිසා එම දුෂ්කරතා අභියෝග විඳගනිමින් ජීවත්වීම අසීරු කටයුත්තක් බව ද ඇය ප්‍රකාශ කළා ය.

එසේම වජිරා සිල්මැණිය ප්‍රකාශ කළේ, කුටිය තුළ තිබෙන තම බඩු භාණ්ඩ ආරක්ෂා කර ගැනීම පූජාභූමිය තුළ දී ඉතා දුෂ්කර කටයුත්තක් බවයි. ඊට හේතුව වශයෙන් ඇය ප්‍රකාශ කළේ අසල සිටින උපාසිකාවන් විසින් ඒවා සොරකම් ලැබීමයි. තව ද, දාන වේලක් නොලැබුණු විට හෝ තමා සතු ව මුදල් නොමැති විට අසල ගම්වලට ගොස් පිණ්ඩපාත සිදු කිරීමේදී ගම්වාසීන්ගෙන් විවිධ හිරිහැර, සිත් රිදවීම් සිදුවන බවත් විශේෂයෙන් විහිළු තහළු කිරීම්, බැණ වැදීම් ආදියට මුහුණපෑමට සිදුවන බවත් ඇය ප්‍රකාශ කළා ය. එසේම මෙත්තා සිල්මැණිය ප්‍රකාශ කළේ ආරාමික ජීවිතයෙන් ඉවත්වී පූජා භූමියට පැමිණිය ද නිසි වාසස්ථානයක් නොමැති වීම නිසා අව්වැසි ආදී ස්වාභාවික පාරිසරික තත්ත්ව හමුවේ විවිධ රෝගවලට ලක් වෙමින් වුවද පූජාභූමිය තුළ ම රැඳී සිටීමට සිදුවීම ඉතා දුෂ්කර තත්වයක් වන බවයි.

ස්ථිර වාසස්ථානයක් නොමැති ව පූජාභූමිය තුළ දීර්ඝකාලීන ව රැඳී සිටින මෙම පිරිස පාදක කොට ගනිමින් පූජාභූමිය ආශ්‍රිත ව සමාජ ගැටලු රැසක් ද වර්ධනය වී පවතී. විශේෂයෙන් යාචකයින් ප්‍රමාණය සංඛ්‍යාත්මකව ඉහළයාම මෙහිදී විශාල ගැටලුවකි. මේ නිසා බැතිමතුන්ගේ වන්දනාමාන කිරීමේ නිදහස යම් ආකාරයකට ඇහිරීම සිදුවේ. එමෙන් ම චීවරයේ අනන්‍යතාව සහ ගෞරවය අභියෝගයකට ලක්වීම ද, මෙහිදී සිදු විය හැක. අපිරිසිදු සිවුරු දරාගෙන, බිම හිඳ, යැපීමේ මාධ්‍යයක් ලෙස චීවරය යොදා ගනිමින් සිදුකරන මෙම ක්‍රියාවලිය තුළ චීවරයේ ගෞරවය පිරිහීම අත්‍යන්තයෙන් සිදු වී ඇත.

තව ද අවිධිමත් මට්ටමින් වාසස්ථාන නොමැති සරණාගත පිරිසක් වර්ධනය වීම ද ගැටලුවකි. මේ නිසා යැපෙන්නන් ප්‍රතිශතය සංඛ්‍යාත්මක ව ඉහළ ගොස් ඇත. මෙම පූජා භූමිය තුළ මෙවැනි සරණාගතයන් වර්ධනයවීම පූජා භූමියේ ගෞරවයට මෙන් ම පැවැත්මට ද තර්ජනයකි. එමෙන් ම කුඩාරම් අටවා ගනිමින් ජීවත්වීමට උත්සාහ දැරීම තුළ පූජාභූමියේ පවිත්‍රතාවට හානි සිදු වේ. විශේෂයෙන් ම ඔවුහු තම අපද්‍රව්‍ය බැහැර කිරීම් සඳහා ද පූජාභූමිය යොදා ගනිති. මේ තත්වය තුළ පූජාභූමියේ පාරිසරික පවිත්‍රතාවට බලපෑම් එල්ල වී

පවතී. එසේ ම ආහාර පිසීම සඳහා ලිප් නිර්මාණය කිරීම තුළ අවට පරිසරයට සිදුවී ඇති හානිය ද සැළකිය යුතු මට්ටමක පවතී. මේ අනුව සිල්මෑණිවරු පාදක කොටගත් සැළකිය යුතු සමාජ ප්‍රශ්න ප්‍රමාණයක් පූජාභූමිය ආශ්‍රිත ව ගොඩනැගී ඇති ආකාරය හඳුනාගත හැක.

## සමාජ ප්‍රතිචාර සහ සිල්මාතා අනන්‍යතාව

මෙම අධ්‍යයනය හරහා මූලික වශයෙන් අවධානය යොමු කරනුයේ ස්ථිර ආරාමයක් නොමැතිව, දිගු කාලයක් තිස්සේ පූජාභූමිය තුළ රැඳී සිටින චීවරධාරී කාන්තාවන් පිළිබඳව ය. නමුත් මොවුන් නිර්වචනය කිරීමේ දී "භික්ෂුණීන්" හෝ "දසසිල්මාතාවන්" වශයෙන් සඳහන් නොකොට සිල්මෑණිවරුන් වශයෙන් යොදා ගැනීම තුළ මතුවන ගැටලුකාරී තත්ත්වය මග හරවා ගැනීම සඳහා "සිල්මෑණිවරු" වශයෙන් හැඳින්වීම කෙරෙහි බලපෑ තත්ත්වයන් විග්‍රහ කිරීමේදී පන්සිල්, දසසිල් හෝ අටසිල් රකින සිල්මෑණිවරුන් හෝ උපාසිකාවන් වශයෙන් මොවුන් වෙන්කොට දැක්වීම ගැටලුසහගත ය.

සිල්මාතාවන් ප්‍රකාශ කරන පරිදි ඔවුන් දස ශීලය ආරක්ෂා කරන පිරිසකි. මෙම අධ්‍යයනයට යොදා ගනු ලැබූ සිල්මෑණිවරුන්ගේ චර්යාව සහ නියැලෙන කෘත්‍යය පිළිබඳ සැලකීමේදී ඔවුන් දසසිල්මාතාවන් වශයෙන් හඳුනාගැනීම අපහසු ය. මොවුන් අතරින් ද ඇතැමුන් අත දසසිල්මාතා අනන්‍යතාව සහිත හැඳුනුම්පතක් පැවතීම සහ දසසිල් මාතා සංගමයේ සාමාජිකත්වය දැරීම වැනි හේතු පදනම් කොට ගෙන දසසිල්මාතාවන් වශයෙන් හඳුනාගත හැකි කිහිපදෙනෙක් වූහ. කෙසේ නමුත් ඔවුන් ද එම සබඳතා අනුව කටයුතු කරන බවක් දක්නට නොවීය.

ආයතනගත දසසිල්මාතාවන්ගේ අදහසට අනුව මොවුන් පැවිදි ජීවිතයට අවමන් කරන පිරිසකි. කුමන හෝ සමාජ ආර්ථික අසහනකාරී තතත්ව තුළ යැපීමේ සහ අනන්‍යතාව ගොඩනගා ගැනීමේ පදනම මත චීවරධාරීව ජීවත්වීම මොවුන්ගේ අපේක්ෂාව යි. මේ නිසා ආගමික ශික්ෂණයෙන්, කෘත්‍යයන්ගෙන් බැහැර ව තම දරු පවුල් හෝ ඥාතීන් නඩත්තුකිරීම වෙනුවෙන් කැපවීම මොවුන් හරහා සිදුවන බව ආරාමික දසසිල්මාතාවන්ගේ මතය යි. ආරාමික දසසිල්මාතාවන් තවදුරටත් ප්‍රකාශ කළ පරිදි පූජා භූමිය ආශ්‍රිත ව විශාල දසසිල්මාතා ආරාම ප්‍රමාණයක් පැවතිය ද ඔවුන් ඒ සඳහා නොපැමිණෙන්නේ, තම අනන්‍යතාව ඔප්පු කිරීමට නොහැකිවීම, ආරමික ජීවිතයේ ශික්ෂණය පවත්වා ගැනීමට ඇති නොහැකියාව සහ යැපුම් මානසිකත්වයෙන් ඉවත්වීමට ඇති දුෂ්කරතා ආදී හේතු නිසාවෙනි. පැවිදි ස්ත්‍රියගේ චරිතය විකෘති කරමින්, චීවරයේ ගෞරවය කෙළෙසන පිරිසක් වශයෙන් පූජාභූමි ආශ්‍රිත චීවරධාරී කාන්තාවෝ ආයතනගත දසසිල්මාතාවන් විසින් බැහැර කරනු ලබති.

එසේම මෙම පිරිස පිළිබඳ ව අදහස් දැක්වූ අටමස්ථානයේ භාරකාරත්වය දරන විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේ නමක් ප්‍රකාශ කළේ, සුදු අඳින උපාසිකාවන් වශයෙන්, කාලයක් පූජාභූමිය තුළ හිඳිමින් කාලයත් සමඟ මොවුන් චීවරධාරී තත්ත්වයට පත්වන බවයි. නමුත් භික්ෂුණියකගෙන්, දසසිල්මාතාවකගෙන් අපේක්ෂා කරන ආගමික ශික්ෂණය හෝ කාර්යභාරයන් ඔවුන් හරහා ඉටු නොවන

අතර බොහෝවිට යාචකයන් වශයෙන් බැතිමතුන්ගෙන් "සිඟමන් යැදීම" මෙම පිරිසගේ දෛනික කාර්යභාරය වන බවකි. එම භික්ෂුව තව දුරටත් ප්‍රකාශ කළේ,

> "බුද්ධ චීවරය දාගෙන මේ කාන්තාවෝ මෙතනදී නොකරන දෙයක් නෑ. පෙලක් වෙලාවට පොඩි දේටත් ගහ මරා ගන්නවා. ඉතිං භික්ෂුණියකගෙන් හරි දසසිල් මාතාවකගෙන් හරි සමාජය අපේක්ෂා කරන විනය, සිල්වත්බව මේ කාන්තාවන් ළඟ තියෙනවා කියලා හිතන්න පුළුවන්ද?" යන්නයි (ධම්මාලෝක භික්ෂුවː 2010.06.20 දින සම්මුඛ සාකච්ඡාව සඳහා ගත කරන ලද කාලය වි. 40යි).

මේ අනුව සමාජය තුළ භික්ෂුණිය හෝ දසසිල්මාතාව පිළිබඳ ගොඩ නැගී ඇති දෘෂ්ටිය මෙම පිරිස හඳුනාගැනීමේදී ප්‍රායෝගික නොවන බව පැහැදිලි වේ. එසේම ක්ෂේත්‍රයේදී පැහැදිලි වූයේ පූජා භූමියට පැමිණෙන බැතිමතුන් තවදුරටත් සිල්මෑණිවරුන් සඳහා සිදු කරන ද්‍රව්‍යමය හෝ මූල්‍යමය උපකාර චීවරයට කරන ගෞරවය මත පදනම් වී පවතින බවත් මෙම පිරිසගේ චරිත පාරිශුද්ධත්වය කෙරෙහි පිළිකුල් සහගත ආකල්පයක් පවතින බවත් ය. සිල්මෑණිවරු පිළිබඳ දරන ආකල්ප විමසූ විට බැතිමතුන්ගෙන් බහුතරයකගේ මතය වූයේ මොවුන් චීවරයේ ගෞරවයට හානි පමුණුවන බවයි. ඒ අතරින් එක් බැතිමතෙකුගේ අදහස වූයේ;

> "මේ පූජා භූමිය බුද්ධ චීවරයට කොයිතරම් වටිනාකමක් ලබාදුන් ස්ථානයක් ද? බුද්ධ වචනයට අනුව භික්ෂුණියක් සංචාරය කරනවා නම් එය ධර්ම ප්‍රචාරය හෝ ආගමික පරමාර්ථයක් වෙනුවෙන් විය යුතුයි. නමුත් මෙතන එහෙම තත්වයක් නෑ. ගිහි තත්වයට වඩා ආගමික හැදියාවත්, ගෞරවයත් පැවිදි අයෙකුට තියෙනවා. නමුත් මේ පිරිස මෙතන බිම ඉඳගෙන, හරියට හිඟන්නො වගේ ඉන්නෙ. ගිහි පැවිදි කියලා මෙතන වෙනසක් නෑ. හැමෝම එකම මට්ටමේ යාචක පිරිසක් විතරයි. මේ නිසා බුද්ධ චීවරයේ ගෞරවය තවදුරටත් ආරක්ෂා කරගන්නට නම් මේ පිරිස ගැන වගකිව යුතු අයගෙ අවධානය යොමු විය යුතුයි" යන්නයි (රත්නසේකරː 2010.06.19 දින සම්මුඛ සාකච්ඡාව සඳහා ගත කරන ලද කාලය වි. 30යි).

මේ අනුව පැහැදිලි වන්නේ සමාජය තුළ ඔවුන් පිළිබඳ ගොඩනැගී ඇති ප්‍රතිරූපයයි. පූජාභූමියේ ආරක්ෂක නිළධාරීන් ප්‍රකාශ කරනු ලැබුවේ මෙම පිරිස තමන් විසින්ම චීවරයක් දරාගෙන ජීවත්වීමට යම් දෙයක් උපයා ගැනීම සඳහා ක්‍රියාකරන පිරිසක් බවයි. එක් පොලිස් නිළධාරියකු තවදුරටත් ප්‍රකාශ කළ ආකාරයට;

> "අටමස්ථානාධිපති හිමියන්ගෙ නියෝගයට අනුව කිසිම පුද්ගලයෙකුට පූජාභූමියේ යාචකයෝ විදියට කටයුතු කිරීමට හෝ කුඩාරම් ගහගෙන ජීවත් වෙන්න අයිතියක් නෑ. ඒකට පටහැනිව ක්‍රියා කරන ගිහි පැවිදි ඕනෑම කෙනෙකු පන්නා දැමීමට අපට අවසර දීල තියෙන්නෙ" (දයානන්දː 2010.06.21 දින සම්මුඛ සාකච්ඡාව සඳහා ගත කරන ලද කාලය වි. 20යි).

එසේම එම පූජා භූමියේ චීවරධාරීව සිටින එක් කාන්තාවක් නිතර සෙසු පිරිස සමඟ අඬදබරවලට යොමුවීම සහ නුසුදුසු චර්යාවන්හි නිරතවීම නිසා ඇය ආමන්ත්‍රණය කිරීමට 'කරාටී' නම් අන්වර්ත නාමයක් ද යොදාගන්නා බව ඔවුහු තවදුරටත් ප්‍රකාශ කළහ. මේ හරහා ගම්‍ය වන්නේ චීවරය කෙරෙහි පවතින ගෞරවය පවා කෙළසමින් කටයුතු කරන පිරිසක් ලෙස ගිහියන්ගේ අවමානයට මොවුන් ලක්වන බවයි. එසේම ප්‍රජාභූමිය ආශ්‍රිත ජංගම වෙළෙඳුන්ගේ අදහස් ද මේ හා සමාන වූ බව පැහැදිලි ය. ඔවුන් දැක්වූ ආකාරයට පොහොය දිනවල දී, බැතිමතුන් වැඩි වශයෙන් සිටින දිනවලදී ඇතැම් අය බුදු පිළිම, බෝ ගස්වල අනුරූප තබාගෙන කුමක් හෝ පිංකමක් සඳහා ආධාර එකතු කරන මුවාවෙන් බැතිමතුන් නොමඟ යවමින් මුදල් හම්බ කරන බවයි. නමුත් ඔවුනට අනුව ඇතැම් චීවරධාරී කාන්තාවන් ආගමික වතාවත්වල නිරත වන ආකාරයක්ද හඳුනා ගත හැකි විය. විශේෂයෙන් බෝධිපූජා පැවැත්වීම, ධර්ම කරුණු කියාදීම ආදිය සඳහා යොමු වූ පිරිසක් ද මෙම පිරිස අතර කලාතුරකින් හඳුනා ගත හැකි බව මොවුන්ගේ අදහස් දැක්වීම් හරහා පැහැදිලි විය. මෙ නිසා ම ඔවුන් බහුතරයකගේ අප්‍රසාදයට පාත්‍ර වන බව පෙනේ.

## ආරාමගත නොවීම කෙරෙහි බලපාන තත්ත්ව

මෙම සිල්මෑණිවරුන් ආයතනගත නොවීමට බලපාන සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලනික සාධක රැසක් හඳුනාගත ගත හැකි විය. මේ පිළිබඳ අදහස් දැක්වූ වජිරා සිල්මෑණිය ප්‍රකාශ කළේ ආරාමවලට වෙනත් අය ඇතුල්වීම කෙරෙහි ආරාමවල දසසිල්මාතාවන් විරුද්ධත්වයක් දක්වන බවයි. විශේෂයෙන් ආරාමික පරිසරය තුළ පවතින ගැටලු බාහිර සමාජයට එළිදරව් වීම සහ සොරකම් සිදුවීම වැනි තත්ත්ව තුළ ඔවුන් ආරාමයෙන් පරිබාහිර කෙනෙකු ආරාමයට ඇතුළත් කරගැනීමට මැළිකමක් දක්වන බව ඇයගේ අදහස විය. නමුත් මෙම චෝදනා ආරාමගත දසසිල්මෑණිවරු ඍජුව ම ප්‍රතික්ෂේප කරති.

සෝමා සිල්මෑණියට අනුව ආරාමික ජීවිතය දැඩි නීති රීති මධ්‍යයේ ගෙන යා යුතු ය. නමුත් තමන් වයෝවෘද්ධ තත්වයක පසුවන බැවින් එම නීති රීතිවලට අනුගත වී කටයුතු කිරීමට හැකියාවක් නොමැති බව ඇය දැක්වූවා ය. විශේෂයෙන් ආරාමයේදී සිදු කළයුතු යම් යම් කාර්යන් සිදු කිරීමට තරම් කාය ශක්තියක් තමන්ට නොමැති නිසාත් තමන් පූජාභූමිය තුළ ගත කරන නිදහස් ජීවිතය අතහැර ආරාමයකට ගොස් තම නිදහස නැතිකර ගැනීමට අකමැති බැවිනුත් ආරාමගත වීමට යොමු නොවන බව ඇය වැඩි දුරටත් ප්‍රකාශ කළා ය. එසේ ම යැපුම් මානසිකත්වයක් සහිත ව දීර්ඝ කාලයක් ජීවත් වී නැවත එක රාමුවකට කොටුවීමට ඇති අකමැත්ත ද මේ හරහා පැහැදිලි කරයි. එමෙන් ම ඛේමා සිල්මෑණිය ප්‍රකාශ කළ පරිදි ඇය පිළිකා රෝගියෙකු නිසා කායික හා මානසික වශයෙන් දුර්වල තත්වයක පසුවෙයි. මේ නිසා ආරාම තුළ පවතින තත්ත්වයන්ට අනුගතවීමටත් වැඩිහිටි මෑණිවරුන්ගේ ඇප උපස්ථාන සිදු කිරීමටත් අපහසු ය. මේ නිසා ඇය ප්‍රකාශ කළේ පූජාභූමිය තුළ තමන් ගතකරන ජීවිතය නිදහසේ ගත කිරීමට අවකාශ පවතින අතර කිසිවෙකුගේ අණකට යටත් නොවී ස්වාධීනව ගත කළ හැකි නිසා ආරාමික ජීවිතය කෙරෙහි තමන් තුළ රුචියක් නොමැති බවයි.

ආරාමයකට ඇතුල්වීමට නම් හොඳ ආර්ථික ශක්තියක් පැවතීම අවශ්‍ය වන බව උත්තරා සිල්මෑණිය ප්‍රකාශ කළා ය. ඇය එදිනෙදා යැපීමට යමක් උපයා ගැනීමට ද දැඩි පරිශ්‍රමයක් දරයි. එසේ සොයා ගන්නා මුදලින් පවා ජීවිතය පවත්වා ගන්නේ ඉතාමත් අපහසුවෙනි. මේ නිසා මුදල් ගෙවා ආරාමයකට ඇතුල්වීමට තරම් ආර්ථික ශක්තියක් ඇයට නොමැති බවත් අකමැත්තෙන් වුව ද, පූජාභූමිය තුළ ජීවත් වීමට සිදුවන බවත් ඇය ප්‍රකාශ කළා ය. මේ ප්‍රකාශයට අනුව ආරාමික ජීවිතයකට ඇය කැමැත්තක් දැක්වුව ද ආර්ථික ශක්තිය හීන තත්ත්වයක පැවතීම ඊට බාධාවක් වී පවතී. ආරාමික ජීවිත ගතකිරීමේදී මුදල් අය කරන බවට වන ප්‍රකාශය ගැටලුකාරී වන්නේ එය බෞද්ධ ඉගැන්වීම්වලට පවා පටහැනි වන හෙයිනි.

ඥාණසීය සිල්මෑණියන් ප්‍රකාශ කළ පරිදි ආරාමික ජීවිතය යනු ගැටලුකාරී පරිසරයක් තුළ ගෙවන්නකි. ඊර්ෂ්‍යාව, වෛරය, ක්‍රෝධය එකිනෙකා පරයා නැගී සිටීමට උත්සාහ දැරීම ආදිය ආරමික පරිසරයක් තුළ දැකිය හැක. මේ නිසා ගුරුගෝල ඝට්ටනය මෙන් ම සෙසු සාමාජිකයන් අතර ගැටුම්ද ආරාම තුළ හඳුනාගත හැකිය. මෙවැනි වියවුල්කාරී වාතාවරණයක් මධ්‍යයේ ජීවත්වීම දුෂ්කර නිසා ආරාමගත නොවී සිටීමට තමාට අවශ්‍ය බව ඇය ප්‍රකාශ කළා ය.

එසේම සංඝමිත්තා ආරාමයේ ප්‍රධාන දසසිල්මාතාවට අනුව පූජාභූමි තුළ සිටින සිල්මෑණිවරුන් යාචක පිරිසක් වශයෙන් හඳුනාගනු ලබන අතර ඔවුන් ආරාමයට බඳවා ගැනීමට අකමැති බව ද ප්‍රකාශ කළා ය. එසේ ම ඇය තවදුරටත් ප්‍රකාශ කළේ පූජාභූමිය ආශ්‍රිත සිල්මෑණිවරුන් ස්වයංව චීවර දරාගත් පිරිසක් බවයි. මෙවැනි තත්ත්ව හමුවේ පූජාභූමි ආශ්‍රිත සිල්මෑණිවරුන් ආරාමයට ඇතුල් කරගැනීමට ආරාමික දසසිල්මාතාවෝ විරුද්ධත්වයක් දක්වති. මේ නිසා තව දුරටත් පූජාභූමිය තුළ ම් 'රුදෙමින් කටයුතු කිරීමට ඔවුන් යොමුවන අතර ආරාමගතවීම ප්‍රතික්ෂේප කෙරේ. ඉහත තත්ත්ව අධ්‍යයනය කිරීමේදී ආයතනගත සහ ආයතනගතනොවූ පිරිස අතර ඇති නිරන්තර මතවාදී ඝට්ටනය පැහැදිලි වේ. විශේෂයෙන් ආරාමික දසසිල්මාතාවන් තම බ්‍රහ්මචර්යා වාසය උසස් කොට සළකමින් පූජාභූමි ආශ්‍රිත සිල්මෑණිවරුන් යාචක පිරිසක් වශයෙන් හඳුනාගැනීම තුළ මෙම ගැටලුවට පිළියම් සෙවීම තව තවත් දුෂ්කර බවට පත් කරයි.

මේ අනුව ආයතනගත නොවීම තුළ තම නිදහස හා ස්වාධීනත්වය පවත්වා ගෙනයාමට ආයතනගත නොවූ පූජාභූමි ආශ්‍රිත ව වෙසෙන සිල්මෑණිවරුන් උත්සාහ දරන ආකාරය පැහැදිලි වේ. නමුත් මේ හරහා ඔවුන්ට හිමි සමාජ වරප්‍රසාද අහිමි වී යන අතර සමාජ චලනතාවට පවතින ඉඩකඩ අවහිර වේ. කෙසේ නමුත්, මෙම පූජාභූමි ආශ්‍රිත ව ජීවත්වන සිල්මෑණිවරුන්ගේ ආරාමගත නොවීම කෙරෙහි පවතින බාධාවන් පිළිබඳ සමාජ සංවේදීත්වය සහ සවිඥ්ඥාණිකත්වය ගොඩනැගීම වැදගත් ය. මේ හරහා ඔවුන්ට අහිමිව පවතින සමාජ වරප්‍රසාද ලබාදෙමින් ඔවුන් සවිබල ගැන්වීමේ අවකාශ පවතින අතර රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධානයක මැදිහත්වීමෙන් ඔවුන්ට නිසි වාසස්ථාන සපයා දී මූලික අවශ්‍යතා සාධනය බෞද්ධ සමාජයකින් ඉටු විය යුතු මූලික යුතුකමක් ලෙස ද සඳහන් කළ හැකි ය.

## නිගමනය

පූජාභූමි ආශ්‍රිත සිල්මෑණිවරුන්ගේ ආයතනගත නොවීමට බලපාන හේතු සාදක විමර්ශනය මූලික අරමුණ කරගනිමින් සිදුකළ මෙම අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලද අනුරාධපුර පූජාභූමියේ දීර්ඝකාලීන ව රැඳී සිටින ආයතනගතනොවූ සිල්මෑණිවරුන්, අසරණභාවයටපත් ලාංකේය ස්ත්‍රීත්වය පිළිබඳ ඛේදනීය යථාර්ථයක් පසක් කරයි. ගිහි ජීවිතයේ ගැටලුකාරි තත්ත්ව, හුදෙකලාව සහ දරිද්‍රතාව, ආගමික නැඹුරුව, සසර කළකිරීම සහ අනිත්‍ය අවබෝධය වැනි තත්ත්ව මොවුන් පැවිදි ජීවිතයට යොමු කිරීමට ඍජු බලපෑමක් සිදුකර ඇත. කායික මානසික වශයෙන් හෝ සමාජ ආර්ථික වශයෙන් ඇති වූ පීඩාකාරි තත්ත්වයන්ගෙන් මිදීම සඳහා උපක්‍රමයක් වශයෙන් පැවිදිභාවය යොදාගෙන ඇත. ගැටලුකාරී තත්වයන්ගෙන් මිදීම මිස ආගමික ශික්ෂණය පවත්වා ගෙනයාම, ආගමික පරමාදර්ශ ළඟාකර ගැනීම පැවිදිභාවය හරහා ඔවුන් බහුතරයක් අපේක්ෂා නොකරති. එමෙන් ම මෙම සිල්මාතාවන් බොහෝ දෙනෙකු විවාහ ජීවිතයක් ගතකොට පසුව පැවිදි ජීවිතය කෙරෙහි යොමුව තිබූ අතර කෘෂිකර්මය ජීවනෝපාය කරගත් ග්‍රාමීය පවුල් නියෝජනය කරති.

අධ්‍යයනයට ලක් කළ සිල්මෑණිවරුන්ගේ හැසිරීම් රටාවන්, යහපැවැත්ම හෝ පැවිදි පරමාදර්ශී භූමිකාව අනුගමනය කිරීමකට වඩා ගිහි තත්වයෙහි ලා සැළකිය හැක්කේ බොහෝවිට ගැටුම්කාරි, ආවේගශීලී හැසිරීම් පළ කරන බැවිනි. යැපුම් මානසික තත්ත්වයක් සහිත මොවුන්ගේ චර්යා රටාවන් ඒ සඳහා ම අනුවර්තනය වී ඇති අතර යාචක වෘත්තිය හා සමාන ක්‍රියාවලියක නිරතවීමට චීවරය යැපුම් මාධ්‍යයක් වශයෙනුත්, අනන්‍යතාව ගොඩනගා ගැනීමේ සංකේතයක් වශයෙනුත් භාවිත කරන්නේ සූක්ෂම ව ය. කෙසේ නමුත්, විශ්ලේෂිත ප්‍රත්‍යයක අධ්‍යයන මගින් ගම්‍ය වන්නේ විකල්ප නොවූ කල්හී, මෙබඳු ඛේදනීය ඉරණමකට ඇතැම් විට මුහුණ පෑමට ස්ත්‍රියකට සිදු විය හැකි බවයි. පූජාභූමිය තුළ මොවුන් ගතකරන අනාරක්ෂිත ජීවිතය හා ඔවුන් කෙරෙහි පවතින අභියෝගය සැළකිය යුතු මට්ටමක පවතින නමුත් සමාජය ඔවුන් සහ ඔවුන් වටා පවතින ගැටලුකාරි තත්ත්ව පිළිබඳ සංජානනය කරනු ලබන්නේ ආගමික පරමාදර්ශයට නුසුදුසු කරන පිරිසක් වශයෙනි. එබැවින් ඔව්හූ අත්‍යන්තයෙන් ම ආන්තීකරණයට ලක්වන්නෝ වෙති.

මෙවැනි දුෂ්කරතා මධ්‍යයේ වුව ද චීවරය අත්නොහැර කටයුතු කිරීමට මොවුන් දැඩි පරිශ්‍රමයක් දරන්නේ චීවරය හරහා ගොඩනගාගත් අනන්‍යතාව හැර ඔවුන්ගේ පැවැත්ම ට තහවුරු කරන වෙනත් මාධ්‍යයක් නොමැති බැවිනි. ඔවුන්ගේ අනන්‍යතාව සහ ඔවුන්ට ලැබෙන සමාජ උපකාර පවා චීවරය මත පදනම් වී පවතී. මේ අනුව පූජාභූමි ආශ්‍රිත සිල්මෑණිවරුන් ස්වකීය පැවැත්ම උදෙසා අවැසි අනන්‍යතාවය ගොඩනගා ගැනීමේ අරගලයක යෙදෙන පිරිසක් වශයෙන් හඳුනාගත හැකි ය. එබැවින් මෙම සිල්මෑණිවරුන් පිළිබඳව සමාජ අවධානය යොමුවීම වැදගත් වන්නේ සංඛ්‍යාත්මකව පූජා භූමි ආශ්‍රිත සිල්මාතාවන්ගේ වර්ධනයක් දක්නට වන හෙයිනි. ඔවුන්ගේ දුෂ්කරතා හඳුනාගෙන ඒවාට පිළියම් සැපයිය යුතු අතර පූජා භූමි ආශ්‍රිත සිල්මාතාවකවීමට බලපාන හේතුවලට ප්‍රතිකර්ම කිරීමද අත්‍යවශ්‍ය වේ.

## පරිශීලිත මූලාශ්‍රය

කොඩිකාර, වත්සලා (2000) *බෞද්ධ කාන්තාවගේ සමාජ කාර්යභාරය*, කොළඹ, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ද සිල්වා, ප්‍රේමකුමාර (පරි) (2009) *යුවත් විජිත බුද්ධදහම*, බොරලැල්ල, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

පෙරේරා, ඉන්ද්‍රානි (2000) *කාන්තාව සහ බුද්ධසමය*, මරදාන, ගොඩගේ සහ සහෝදරයෝ.

මිත්‍රාඥාණිස්සරි (1993) "සිල්මාතා සංවිධානයේ ඓතිහාසික පසුබිම සහ එහි වර්තමාන තත්ත්වය " ඩබ්. ජී. වීරරත්න, සිරිසේන තුඩුවගේ සහ පද්මා රෝහිනී දිනපාල (සංස්:) *2300 සංඝමිත්තා ජයන්ති සංග්‍රහය*, කොළඹ, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, පිː පි. 127-144.

විජේබණ්ඩාර, චන්දිම (1993) "අනගාරික ජීවිතයක් ගෙවන වත්මන් දසසිල් මාතාවන් මගින් ඇති කළ හැකි ආගමික ප්‍රබෝධය". ඩබ්. ජී. වීරරත්න, සිරිසේන තුඩුවගේ සහ පද්මා රෝහිනී දිනපාල (සංස්:) *2300 සංඝමිත්තා ජයන්ති සංග්‍රහය*, කොළඹ, බුද්ධ ශාසන අමාත්‍යාංශයේ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, පිː 121-123.

විජේසුන්දර, සෙනරත් (1993) *භික්ෂුණී ශාසනායේ වර්තමාන තත්ත්වය*, එච් එම් මොරටුවගම (සංස්) දහම් අමාː 2300 අනුබුදු මිහිඳු ජයන්තිය. කොළඹ, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව.

සුමනජෝති, පල්ලත්තර (2003) *බුදුන්වහන්සේ ලබා දුන් කාන්තා නිදහස*, මරදාන, ඇස්. ගොඩගේ සහෝදරයෝ.

Bartholomeusz, Tessa (1994) *Women Under The Bo Tree*, New York, Cambridge University Press.

Gombrich, Richard and Gananath Obeyesekere (1988) *Buddhism Transformed: Religious Change in Sri Lanka*, Princeton, Princeton University Press.